## 2022/11/09දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2022/11.09 දින පෙ.ව. 09.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

**01. ආගම සිහි කිරීම**

2022.11.09 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. අද දින මහා සභා රැස්වීම අතරතුර අප සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා සම්බන්ධ කර ගෙන මෙම සභා වාරය විශේෂිත සභා වාරයක් ලෙස පවත්වන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව අද දින මහා සභා රැස්වීමට සපැමිණි ඔබතුමන්ලා සහ ඔබතුමියන්ලා මම ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එහෙමනම් වෙනදා වගේ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරමු.

**(අ)01. 2022.10.11දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත.**

2022.11.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී එන්.ඩබ් පතිනායක මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රි සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**නැත.**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01.ඉන්දියන්වෝක් වත්ත, උඩුගම දකුණ, උඩුගම. වෙතින් නිකුත් කරනලද කෘෂිභෝග අලෙවි මධ්‍යස්ථානයක් ලබාගැනීම සම්බන්ධව 2022.10.19 දිනැති ලිපිය සභාගතකරනලදී.

02.රණවිරු සුහසාධක සංගමය රණවිරුගම, ඇතුමලේ,ගාල්ල. වෙතින් නිකුත් කරනලද කෙටිකාලීන බෝග වගාවන් සඳහා රජයසතු ඉඩම් කොටස ලබාදීම සම්බන්ධව 2022.10.18 දිනැති ලිපිය සභාගතකරනලදී.

03.ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව,උඩුගම. වෙතින් නිකුත් කරනලද අපද්‍රව්‍ය බැහැරකිරීම සම්බන්ධව 2022.11.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04.දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , ගාල්ල.2022 සැප්තැම්බර් මස 16 වන දින පැවති ගාල්ලදිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණ දැනුම්දීම .නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගම ,බාර් හන්දිය ආසන්නයේ පිහිටි ඇති මත්ස්‍ය අලෙවි මධ්‍යස්ථානය නැවත ආරම්භ කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට පවරාදීම සම්බන්ධව 2022.11.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය සඳහා වැඩසටහනේ ඔක්තොම්බර් මස සතියකට දින 02 ක් බැගින් දින 08 ක් ප්‍රාදේශීය සභා පෙර පාසල් දරුවන්ට ආහාර ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. ජූලි මස පෙර පාසල් ළමුන්ගේ ප්‍රමාණය පදනම්

කර ගෙන ප්‍රතිපාදන වෙන් වී ඇති නමුත් වර්තමානය වන විට පෙර පාසල් 14 හිම ළමුන් 16 දෙනෙකු අලුතින් පෙර පාසල්වලට බඳවා ගෙන ඇත. එහෙයින් එම දරුවන් 16 දෙනාගේ ආහාර වේල සඳහා රු. 7680.00 ක මුදලක් සහා අරමුදලින් වියදම් කිරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

02. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් කරන ලද ඉල්ලීමට අනුව අංක 194 ඒ ග්‍රාම නිලධාරී වසමේ ගල්ලෙනමුල්ල කොණ්ඩුගොඩකන්ද ප්‍රවේශ මාර්ගයක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සම්බන්ධව අංක 1887 දරන මැණුම් ඉල්ලීමට අදාල මැණුම් ගාස්තුව ලෙස රු. 34500.00 ක මුදල ජ්‍යේෂ්ඨ මිනින්දෝරු අධිකාරි- ගාල්ල වෙත තැන්පත් කරන ලෙස අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

03. 2022 වර්ෂය සඳහා සේවක සුභසාධනය සඳහා අයවැයෙන් වෙන් වී ඇති රු. 100000.00 ක මුදල සහා අරමුදලින් වියදම් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

04. අයාලේ යන ගවයින් අල්ලා බැද තැබීමට අවශ්‍ය ගව ගාල තැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

05. 2023 වර්ෂය සඳහා අයවැය කෙටුම්පත සහා අනුමැතිය සඳහා ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

06. නාගොඩ ප්‍රාදේශීය සභාව සතු සතිපොළවල්වලින් අය කරන කඩ බදු මුදල් පහත පරිදි වැඩි කිරීම සඳහා සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

උඩුගම හා තල්ගස්වල මාළු වෙළඳසැල්වල වර්ග අඩි ප්‍රමාණයට අනුව අය කිරීමට යෝජනා කරමි.

වර්ග අඩි 20 = රු. 500.00

ඌරු මස් වෙළඳසැල = රු. 1500.0

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ)2.රැස්වීම් රීති 11(8) යටතේ ඉදිරිපත්කරන යෝජනා**

07.2023 වර්ෂයට ආදායම් රැස්කිරීමට අදාල යෝජනාව 2023 වර්ෂයට බලපත්‍ර ලබාගැනීමේදී ගාස්තු පැනවීම යෝජනාව සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට මෙම යෝජනාව

2022/10/11 දින සභා වට ඉදිරිපත් කල නමුත් ඒහිදී තීරණය වූයේ කමිටුවකට දමා වැඩිදුරටත් කරුණු පැහැදිලිකර ගතයුතු බවයි . ඒ අනුව 2022.11.04 පැවති මුදල් කමිටුවට යොමුකොට එහි තීරණය වූයේ අදාල වෙනස්වීම් වලට සහ 2023 වර්ෂයට ආදායම් රැස්කිරීමට අදාල යෝජනාවට කමිටු සාමාජිකයන් සියළුදෙනා එකගතාවය පලකර ඇති අතර ඒ සදහා මුදල් කමිටුවේ එකගතාව පළ කර ඇති අතර ඒ අනුව 2023 වර්ෂය සදහා පහත පරිදි ආදායම් පැනවීමට එකඟතාව ලැබී ඇත.

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට ආදායම් රැස් කිරීමට අදාළ යෝජනාව**

## I. 2023 වර්ෂයට බලපත්‍ර ලබාදීමේදී ගාස්තු පැනවීම

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ නාගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උප ලේඛනයේ I වන තීරයේ නිරූපිත යම් කාර්යක් සඳහා නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේදී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කල යුතු බවටත් 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත යටතේ කාර්ය සදහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගන්නා හෝටලයක්,ආපන ශාලාවක් හෝ නවාතැන්පලක් ඉහත කී උපලේඛනයේ II වන අවස්ථාවක තීරුවේ කුමක් සදහන් වුවද එකී හෝටලය, නවාතැන්පල, ආපනශාලාව පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් එකී හෝටලයේ, ආපන ශාලාවේ, නවාතැන්පලේ 2022 වර්ෂයට ලැබූ ආදායමෙන් 1% බලපත්‍ර ගාස්තුවක් විය යුතු බවත් ගරු සභාවට යෝජනා කරමි.

**උපලේඛනය**

**1 තීරුව** **11 තීරුව**

| අනු අංකය | බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක | රු.1500 ඉක්මවන අවස්ථාවක |
| 1 | භෝජනාගාරයක් හෝ හෝටලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 2 | තේ හෝ කෝපි කඩයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 3 | බත් කඩයක් (කෑමට හෝ පාර්සල්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 4 | ආපන ශාලාවක් පවත්වා ගෙන යාම (සංචාරක මණ්ඩලයේ | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ලියාපදිංචි නොවූ) | | | |
| 5 | ලැගුම්හලක් පවත්වා ගෙන යාම (සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොවූ) | 500.00 | 750.00 | 1,000.00 |
| 6 | බේකරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 7 | මස් විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 8 | මාළු විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 9 | ශීතකරණවල තබා මස් හෝ මාළු ගබඩා කිරීම විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | පිසින ලද ආහාර සකස් කර සපයන ස්ථානයක් පවත්වා ගෙන යාම (කේටරින් සර්විස්) | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | නරක් විය හැකි ආහාර ද්‍රව්‍යය හා කුලු බඩු තොග හා සිල්ලරට විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | කොණ්ඩා කැපීම, මසාජ් කිරීම සඳහා බාබර් සාප්පුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | රස කැවිලි නිපදවීම, කේක් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

**අප්‍රසන්න වෙළඳාම්**

| | | | | |
|---|---|---|---|---|
| 01 | ඝෝගාතකාගාරයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 02 | කුකුළන් 1000ට අඩු කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000,0( |
| 03 | කුකුළන් 1000ට වැඩි කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 04 | ඌරන් 25ට අඩු ඌරු කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.0( |
| 05 | ඌරන් 25ට වැඩි ඌරු කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 06 | එළදෙනුන් 25ට අඩු ඇති කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.0( |
| 07 | එළදෙනුන් 25ට වැඩි ඇති කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 08 | කුල්ස්පොට් එකක් හෝ කිරිහලක් හෝ ස්නැක් බාර් එකක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 09 | පපඩම් හෝ නූඩ්ලස් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 10 | අයිස් ක්‍රීම් , යෝගට්, බීම පැකට් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,0( |
| 11 | ජෑම්, සිරප්, සෝස් වර්ග, නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 12 | කරවල, ජාඩි, වේලීම හෝ විකිණීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 13 | කුරුඳු තැලීම, කුරුඳු තෙල් මඩුවක් පවත්වා ගෙන යාම හෝ කුරුඳු දර විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.0( |
| 14 | ඔසු පැන්හලක් , කොළ කැඳ හෝ බැදපු කඩල, රටකජු (ටේස්ටි කඩල) විකිණීම | 500.00 | 750.00 | 1,000.0( |

| | | | | |
|---|---|---|---|---|
| 15 | පානිය ජලය බෝතල් කර ගබඩාකර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 16 | පොල්තෙල් මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 17 | මෙඩි ලැබ් එකක් (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීමේ) ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 18 | පශු වෛද්‍ය ගිලන් හලක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 19 | ත්‍රීරෝද රථ මෝටර් සයිකල් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 20 | අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක් ) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

**අන්තරාදායක ව්‍යාපාර**

| | | | | |
|---|---|---|---|---|
| 01 | කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 02 | සිමෙන්ති බ්ලොක් ගල්, මල් පෝච්චි, බීරලු නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම,සත්ව ආහාර වර්ග නිපදවීම, ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | ලියවන පට්ටලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | වෙල්ඩින් වැඩ පළක් හෝ ඩ්‍රිල් වැඩ පළක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | ලී මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | යන්ත්‍රානුසාරයෙන් කලුගල් ඇඹිරීම, ගල් පිපිරවීමේ ගල් මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | වී පාහින මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩ පළක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | බැටරි චාර්ජ් කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | ෆයිබර් ග්ලාස් වැඩ පලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 14 | යකඩ කම්හලක් පවත්වා ගෙන යාම (යන්ත්‍ර ඇති/නැති) | 500.00 | 750.00 | 1000.00 |
| 15 | මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

## නාගොඩ ප්‍රාදේශීය සභාව
## II. 2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

### යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය (1) වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත කරගෙන යනු ලබන පහත සඳහන් උපලේඛනයෙහි I වන තීරුවෙහි සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයෙහි II වන තීරුවෙහි එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කල යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර නාගොඩ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

### වෙළඳාම් කර්මාන්තයේ ස්වභාවය

| | | | | |
|---|---|---|---|---|
| 1. | පොල් එකතු කරීමේ හෝ තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 2. | සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 3. | ලී වෙළඳ සැලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 4. | පොල් පරාල හා යට ලී විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 5. | දර මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 7. | සාමාන්‍ය වඩු මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8. | මැටි බදුන් නිපදවීම ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 9. | සාප්පු බඩු මනි බඩු සුවඳ විලවුන් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10. | ත්‍රිරෝද රථ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11. | පාවහන් අලෙවිකරණ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථානයක් (ලොන්ඩ්‍රියක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000,00 |
| 13. | සිල්ලර කඩයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 14. | එළවළු හෝ පළතුරු විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 15. | පාපැදි අලුත්වැඩියා කිරීමේ (වින්කලයක්) ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 750.00 |
| 16. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් (ගරාජයක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 17. | පාපැදි විදුලි භාණ්ඩ ශිතකරණ හෝ මහන මැෂින් හා අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 18. | විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 19. | විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | සම් භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 21. | බුලත්, පුවක්, කොහු, ඉදල්, කෙසෙල් කැන්, පලා වර්ග, මැටි භාණ්ඩ, තැඹිලි විකිණීම (සාමාන්‍ය වෙළඳාම) | 500.00 | 750.00 | 1000.00 |
| 22. | සිංහල බෙහෙත් ශාලාවක් පවත්වා ගෙන යාම හෝ සිංහල බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | දන්ත චිකිත්සාගාරයක් දත් බඳින ස්ථානයක් එක්ස්රේ යන්ත්‍රයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 24. | විකිණීම සඳහා බිම්මල් හෝ වෙනත් මල් පැල වර්ග තවාන් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 25. | ප්ලාස්ටික් භාණ්ඩ විකුණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 26. | ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 27. | මනාලියන් හැඩ ගැන්වීම (බියුටි සැලුන්) උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 28. | රෙදි පිලි විකිණීමේ ස්ථානයක් (රෙදි කඩයක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 29. | ඇදුම් මැසීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 30. | ඇස් කණ්නාඩි නිපදවීම, විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 31. | ඡායාරූප ශාලාවක් (ස්ටුඩියෝවක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 32. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 33. | සි.ඩි,වි.සි.ඩි, විඩියෝ කැසට් ගීත පටිගත කිරීම හෝ විකිණීම පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 34. | ලිපි ද්‍රව්‍ය, පුවත්පත්, සගරා, පාසැල් උපකරණ (බුක්ෂොප්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 35. | දෙස් විදෙස් දුරකථන ඇමතුම් ලබාදීමේ ස්ථානයක් (කමියුනිකේෂන්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 36. | ක්ෂණික ඡායා පිටපත් කිරීම, රෝනියෝ කිරීම, ලැමිනේටින් කිරීම, යතුරු ලියනය කරදීම ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 37. | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | පරිගණක යන්ත්‍ර විකිණීමේ අලුත්වැඩියා කිරීම, පුහුණු පාඨමාලා පැවැත්වීම ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 38. | විදේශ චෙක්පත් (මුදල්) මාරු කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 39. | කුෂන් වැඩ පලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 40. | අට පිරිකර පුජා භාණ්ඩ ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 41. | සංගිත භාණ්ඩ කුලියට දිම හා නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000,00 |
| 42. | කිරුම් මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 43. | මදුරු දැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 44. | පුවත්පත් දැන්වීම් පළ කිරීමේ ඒජන්සියක් හෝ පුවත්පත් විකිණීම සදහා ඒජන්සියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 45. | බෝට්ටු ඔරු සේවාවන් පවත්වා ගෙන යාම (තොටුපොළක්) | 500.00 | 750.00 | 1,000.00 |
| 46. | ජුකි මැෂින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 47. | සෙලියුලර් දුරකථන හා දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 48. | පරණ යකඩ  බඩු , ප්ලාස්ටික් භාණ්ඩ, හිස් බෝතල්, පත්තර, ගෝනි ගබඩා කර තැබීම හා  විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 49. | පිගන් භාණ්ඩ (පෝසිලේන්, සිල්වර් භාණ්ඩ ඇතලු ) ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 50. | සුරතල් මසුන් ඇති කිරීම, විකිණීම, හා මාළු ටැංකි සැදිම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 51. | රේස් මුදල් ඔට්ටු එකතු කිරීමේ  ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 52. | අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 53. | ක්‍රීඩා භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 54. | සිසිල් බීම ඒජන්සියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 55. | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් (කුටියක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 56. | දැන්වීම් පුවරු ඇදිම, ප්ලාස්ටික් අංක තහඩු සැකසිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 57. | යතුරු පැදි හා පාපැදි ආරක්ෂා කර දිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 58. | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | වානේ ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 59. | මල් පැළ වර්ග, බෙහෙත් පැළ වර්ග හා වෙනත් පැළෑටි වර්ග විකිණීම හෝ තවාන් කිරීම හා ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 60. | ලි බඩු හෝ වෙනත් ඔනෑම ජංගම විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම (දිනකට) | 500.00 | 750.00 | 1,000.00 |
| 61. | ස්ථාවර හා ජංගම දුරකථන සම්බන්ධතා නිකුත් කිරීමේ තාවකාලික වෙළඳ කුටියක් පවත්වා ගෙන යාම (දින 1 සිට 7 දක්වා) | - | - | 1,000.00 |
| 62. | බැංකු වලින් උකස් කර බේරා නොගත් භාණ්ඩ වෙන්දේසි කිරීමේදී එක් දිනකට අය කිරීම | 500.00 | - | - |
| 63. | ජංගම වෙළඳාම කරත්තයක හෝ වාහනයක පවත්වා ගෙන යාම (වාර්ෂිකව) (කරවල, වියලි හෝ සැකසු ආහාර, පලතුරු වර්ග, එළවලු) | - | 750.00 | - |
| 64. | ඇලුමිනියම් භාණ්ඩ විකිණීම ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1,000.00 |
| 65. | බලවේග යන්ත්‍ර මගින් නූල් නිෂ්පාදනය, පුලුන් සකස් කිරීම හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 66. | වායු සමිකරණ යන්ත්‍ර , ශිතකරණ , පරිගණක යන්ත්‍ර සෙලියුලර් දුරකථන අලුත්වැඩියා කරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 67. | මෝටර් කොයිල් එතිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 68. | බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කරීමේ හා විකිණීම ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 69. | විදුලි බලයෙන් හෝ අත් යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 70. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනි යන්ත්‍ර, කැමරා වීඩියෝ , ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 71. | අතින් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 72. | ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදිමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 73. | විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 74. | කොහු මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 75. | පොල් ලෙලි හා දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 76. | හුණු වැරටි පිලිස්සිම සදහා පෝරණුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 77. | හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 78. | හම් වර්ග වලින් හෝ රබර් වර්ගවලින් භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 79. | රබර් බුෂ් සාදන වැඩ පලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 80. | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | රබර් දුම් ගෙයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 81. | ගිනිකෙළි භාණ්ඩ රතිඤ්ඤා නිපදවීම හෝ විකිණීම ගබඩා කිරීම පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 82. | වාහන ගෑස් කිරීම හෝ ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 83. | ගෑස් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 84. | රෙදි පින්තාරු කිරීම (බතික් වැඩ පලක් ) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 85. | ස්වාර්ණාභරණ නිපදවීම හා අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 86. | ස්වාර්ණාභරණ පාට කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 87. | මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 88. | සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 89. | ලෝහ භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 90. | පිත්තල භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 91. | ටයර් ටියුබ් වෝල්ක් නයිසිං කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 92. | අලුත් හෝ පරණ ටයර් ටියුබ් ගබඩා කිරීම කට්ටා කැපීම විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 93. | කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම විකිණීම ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 94. | වාහන ගාල් කර තැබීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 95. | පොල් තෙල් හැර වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 96. | බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 97. | ග්‍රොසරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 98. | මිරිස් ධාන්‍ය වර්ග, පිටි ඇඹරුම් හලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.**

## නාගොඩ ප්‍රාදේශීය සභාව
## III. 2023 වර්ෂය සදහා ව්‍යාපාර බදු පැනවීම

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ සහ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්ධක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා යම් වෘත්තීන් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2023 වර්ෂයේදී කර ගෙන යනු ලබන සෑම තැන්තතෙකුම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබූ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවෙහි අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව ව්‍යාපාර බද්ධක් 2023 වර්ෂය සදහා පනවා

අය කිරීමටත් බද්දට යටත් තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ධ 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර නාගොඩ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

**උපලේඛනය**

| | **වර්ෂය සඳහා ව්‍යාපාරයේ හෝ වෘත්තියේ ආදායම්** | **අය කිරීමට තිරණය කල බදු මුදල (රු.)** |
|---|---|---|
| | **I වන තීරුව** | **II වන තීරුව** |
| 1 | රු. 6000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2 | රු. 6000 ඉක්මවන එහෙත් රු. 12000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| 3 | රු. 12000 ඉක්මවන එහෙත් රු. 18750 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| 4 | රු.18750 ඉක්මවන එහෙත් රු. 75000 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| 5 | රු. 75000 ඉක්මවන එහෙත් රු. 150000 නොඉක්මවන අවස්ථාවක | 1,200.00 |
| 6 | රු. 150000 ඉක්මවන අවස්ථාවක | 3,000.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

## නාගොඩ ප්‍රාදේශීය සභාව
## iv. 2023 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් නාගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිති පතා ගොවිතැනක් යටතේ වූද

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරක් ම මත 2023 වර්ෂය සඳහා රු 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු ඇමතිතුමා විසින් නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989.02.03 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින් , හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2023 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

## නාගොඩ ප්‍රාදේශීය සභාව

## v. 2023 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ අංක 122 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988 /08/23 වැනි දින අංක 520/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදි ජනරජයේ iv (ආ) කොටසේ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වෙනි කොටසේ ප්‍රචාරක / දෘෂ්‍ය පරිසර පිලිබද අතුරු ව්‍යස්ථා විධිවිධාන ප්‍රකාර නාගොඩ ප්‍රාදේශිය සභා සිමාව තුළ යම් වීථියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සදහන් බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සදහා පනවා 2023.01.01 සිට නාගොඩ ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි

**උප ලේඛනය**

| | **ප්‍රචාරක දැන්වීම්** | **(රු.)** |
|---|---|---|
| **1** | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සදහා සෑම වර්ග අඩියකට (වර්ෂයකට) | 200.00 |
| **2** | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සදහා වර්ග අඩියකට (මසකට) | 100.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

## නාගොඩ ප්‍රාදේශීය සභාව

## vi. 2023 වර්ෂයට ප්‍රසිද්ධ රග දැක්වීමේ ආඥා පනත අනුව බදු පැනවීම

## යෝජනාව

ප්‍රසිද්ධ රග දැක්වීමේ ආඥා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු නාගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල 2023 වර්ෂයට පහත උපලේඛනයේ සදහන් පරිදි පනවනු ලබන ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛනය**

1 තාවකාලික චිත්‍රපට දර්ශනය, සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය සංදර්ශන හෝ වෙනත් යම් සංදර්ශනයක් සදහා **(රු.)**

| | |
|---|---|
| එක් දිනකට බලපත්‍ර ගාස්තුව | 1000.00 |
| වැඩි වන සෑම දිනකටම | 500.00 |
| 2 සංගිත සංදර්ශන සදහා එක් දිනකට | 1000.00 |

3 ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට දහය (10%) විනෝද බද්ද

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**නාගොඩ ප්‍රාදේශීය සභාව**
**2023 වර්ෂය**

## vii. පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු හා නාගොඩ ප්‍රාදේශීය සභාව සතු දේපල සහ නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු අය කිරීම නිවාස සහ නගර සංවර්ධන ආඥා පනත අනුව

**යෝජනාව**

නාගොඩ ප්‍රාදේශීය සභා බල සීමාව තුල සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන්ගෙන් සහ ඉඩම් අනුබෙදුම් මත අයකරනු ලබන පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු සහ නාගොඩ ප්‍රාදේශීය සභාව සතු දේපල සහ නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් පහත උපලේඛනවල සඳහන් ආකාරයට 2022 වර්ෂයට ගාස්තු ගෙවිය යුතු බවට මෙයින් ගරු සභාවට යෝජනා කරමි.

**උපලේඛන 01** රු. ශත

| | |
|---|---|
| පර්චස් 06 සිට 20 දක්වා එක් කැබැල්ලකට | 250.00 |
| පර්චස් 21 සිට 40 දක්වා එක් කැබැල්ලකට | 300.00 |
| පර්චස් 41 සිට 60 දක්වා එක් කැබැල්ලකට | 400.00 |
| පර්චස් 61 සිට 120 දක්වා එක් කැබැල්ලකට | 450.00 |
| පර්චස් 121 සිට 160 දක්වා එක් කැබැල්ලකට | 500.00 |

පර්චස් 161 සිට වැඩිවන සෑම පර්චස් එකකට හෝ ඉන් කොටසකට රු 20 බැගින් අය කල යුතුය

**ගොඩනැගිලි ඉදි කිරීම මත ගාස්තු පැනවීම - 2023**

**උපලේඛන 02**

| ගොඩනැගිලි වල විශාලත්වය අනුව ගෙවීම | පදිංචිය සඳහා (රුපියල්) | වාණිජ හෝ වෙනත් කටයුත්තක් සඳහා (රුපියල්) |
|---|---|---|
| වර්ග මීටර් 45 ට අඩු | 150.00 | 300.00 |
| වර්ග මීටර් 45 - 90 | 250.00 | 500.00 |
| වර්ග මීටර් 91 - 180 | 500.00 | 1000.00 |
| වර්ග මීටර් 181 - 270 | 1000.00 | 2000.00 |
| වර්ග මීටර් 270 ට වැඩිවන සෑම වර්ග මීටර් 10 කට අමතරව එක්විය යුතු මුදල | 100.00 | 300.00 |
| මායිම් තාප්පයක් සඳහා (වර්ග මීටරයක් සඳහා) | 50.00 | 100.00 |

**විධිමත් බලපත්‍රයක් නොමැතිව කරනු ලබන ඉදිකිරීමක් හා භාවිතය වෙනස් කිරීමක් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු -2023**

**උපලේඛන 03**

| ඉදිකිරීම් අදියර | නේවාසික වර්ග මීටර් එකක් සඳහා ගෙවිය යුතු ගාස්තුව | වාණිජ හෝ වෙනත් වර්ගමීටර් එකක් සඳහා ගාස්තුව |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| 1. අත්තිවාරම් මට්ටම | 20.00 | 50.00 |
| 2. වහල මට්ටම සඳහා ඉදිකොට ඇති විට | 40.00 | 100.00 |
| 3. වහල ඇතුලුව ඉදිකොට ඇති විට | 60.00 | 150.00 |
| 4. සම්පූර්ණයෙන් ඉදිකර ඇති විට | 100.00 | 200.00 |

මායිම් තාප්පයක් සඳහා දික් මීටරයකට රු 800.00 බැගින් (දික් අඩියකට රු. 250 බැගින්)

**ගොඩනැගිලි වල භාවිතය වෙනස් කිරීම සඳහා පෙරසැරි ගාස්තු**

**උපලේඛන 04**

| බිම් වර්ග ප්‍රමාණය | ගාස්තුව ( රුපියල්) |
|---|---|
| 500 දක්වා | 100.00 |
| 500 - 1 000 | 200.00 |
| 1001 - 2000 | 300.00 |
| 2001 - 3000 | 400.00 |
| 3001 - 5000 | 600.00 |
| 5001 - 7500 | 800.00 |
| 7501 - 10 000 | 1000.00 |
| 10 000 ට වැඩි | 1000 සහ ඉන් වැඩි වන සෑම අමතර වර්ග අඩි 100 ට හෝ ඉන් කොටසකට රු 50 බැගින් |

**නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් උඩුගම බහු කාර්ය ගොඩනැගිල්ල, ක්‍රීඩාංගන, ජල බවුසර්, වතුර ටැංකි, ටිප්පර් රථ, ට්‍රැක්ටරය කුලීයට දීම - 2023**

**එක් දිනක් සදහා උඩුගම බහු කාර්ය ගොඩනැගිල්ල (පුටු 320 ක් සමග) ලබා දීමේ ගාස්තුව**

**උපලේඛන 05**

| | |
|---|---|
| පොදු කටයුතු සදහා (රජයේ ආයතන, පාසල් සදහා) | - රු. 10000.00 |
| පෞද්ගලික කටයුතු සදහා | - රු. 15000.00 |
| තැන්පත් මුදල | - රු. 5000.00 |
| ජලය හා විදුලිය සදහා | - රු. 1000.00 |

**ක්‍රීඩාංගන කුලීයට දීමේ ගාස්තු**

**උපලේඛන 06**

| ක්‍රීඩාංගනය | පොදු / රාජ්‍ය කටයුතු (රු.) | පෞද්ගලික කටයුතු (රු.) |
|---|---|---|
| මාපලගම ක්‍රීඩාංගණය | 1500.00 | 2500.00 |

| | | |
|---|---|---|
| උඩුගම ක්‍රීඩාංගණය | 1500.00 | 2500.00 |
| ගෝණදෙනිය ක්‍රීඩාංගණය | 1500.00 | 2500.00 |
| උඩුගම දකුණ ක්‍රීඩාංගණය | 1500.00 | 2500.00 |

**ජල බවුසර් සහ වතුර ටැංකි කුලියට දීමේ ගාස්තු**

**උපලේඛන 07**

| | ලීටර් 4000 (රු.) | ලීටර් 6000 (රු.) | ලීටර් 8000 (රු.) |
|---|---|---|---|
| එක් දිනකට සහා බල ප්‍රදේශය තුල අය කරන ගාස්තුව | 10000.00 | 12000.00 | 15000.00 |
| එක් දිනකට සහා බල ප්‍රදේශයෙන් පිටත අය කරන ගාස්තුව | 11000.00 | 13000.00 | 16000.00 |

**ටිපර් රථය (කියුබ් 3) කුලියට දීමේ ගාස්තු**

පැය 8 ක් සඳහා 50Km දක්වා රු. 20000.00

පැය 8 කට වැඩිවන සෑම පැයකට රු. 2600.00

50Km ට වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 100 .00

**ට්‍රැක්ටරය කුලියට දීමේ ගාස්තු**

ට්‍රැක්ටර් පැයකට 5**Km** දක්වා (ට්‍රේලරය සමඟ) - රු. 1000.00

වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම - රු. 400.00

***වතුර රහිතව ලීටර්** 2000 **ටැංකිය කුලියට දීමේ ගාස්තුව** - එක් දිනක් සඳහා - රු. 2000.00

- ජල බවුසර්, ටිපර් රථ, ට්‍රැක්ටරය, වතුර ටැංකි සහ සභාව සතු අනෙකුත් වාහන කුලියට දීමට අදාළ ගාස්තු 2023 වර්ෂයේ සිදුවිය හැකි ඉන්ධන මිල වෙනස් වීම් සහ රට තුළ ඇතිවිය හැකි ආර්ථිකමය වෙනස් වීම් මත සංශෝධනය කිරීමට ප්‍රාදේශීය සභාවට සම්පූර්ණ බලය ඇති බවද ගරු සභාවට යෝජනා කරමි.

**ආකෘති පත්‍ර සේවා සඳහා අය කරනු ලබන ගාස්තු**

**උපලේඛන 08**

1. වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තු රු. 750.00
2. අන්තරාදායක කොස් ගසකට බලපත්‍ර දීම සඳහා ගාස්තුව රු. 2000.00
3. අන්තරාදායක වෙනත් ගසක් සඳහා බලපත්‍ර දීමේ ගාස්තු රු. 1000.00
4. දේපළ අයිතිය සනාථ කිරීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව රු. 200.00
5. ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු රු. 1000.00
6. නැවත බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු රු. 500.00
7. වෙනත් සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව රු. 200.00
8. මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව රු. 750.00
9. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අයදුම්පත් ගාස්තු රු. 100.00
10. පාරිසරික බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු රු. 100.00
11. ජල නළ එළීම සඳහා පාරවල් පලුදු කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු රු. 200.00
12. ජල නළ එළීම සඳහා පාරවල් පලුදු කිරීමේ පෙරසැරි ගාස්තු රු. 500.00
13. ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතිකය නිකුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු රු. 500.00

14. ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතිකය නිකුත් කිරීමේ ගාස්තු

| | | |
|---|---|---|
| a. | නේවාසික භාවිතය සඳහා | රු. 1000.00 |
| b. | වාණිජ භාවිතය සඳහා | රු. 1500.00 |

15. අනුමත ගොඩනැගිලි සැළසුම් කාලය දීර්ඝ කිරීමට අදාළ ගාස්තු

| | | |
|---|---|---|
| a. | පළමු අවුරුද්ද සඳහා | රු. 150.00 |
| b. | දෙවැනි අවුරුද්ද සඳහා | රු. 200.00 |
| c. | තෙවනි අවුරුද්ද සඳහා | රු. 250.00 |

(උපරිම කාලය දීර්ඝ කිරීම වර්ෂ 03 ක් පමණි)

16. ඉඩමක් වෙන්දේසි කිරීමක් සඳහා අය කරන ගාස්තුව

| | | |
|---|---|---|
| a. | සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තුව | රු. 100.00 |
| b. | සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු | රු. 1000.00 |
| c. | කැබලි සැළසුම් අනුමත කිරීමේ අයදුම්පත් ගාස්තු | රු. 500.00 |
| d. | කැබලි සැළසම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තුව (ඉඩමේ ඔප්පුවේ වටිනාකම අනුව) | |
| | (අ.) රු. 25,000.00 හෝ ඊට අඩු වන විට | රු. 1000.00 |
| | (ආ.) රු. 25,001 සිට රු. 500,000.00 දක්වා | රු. 5000.00 |
| | (ඇ.) රු. 500,001.00 සිට රු. 1,000,000.00 | රු. 10000.00 |
| | (ඈ.) රු. 1,000,000.00 ට වැඩි | රු. 15000.00 |
| e. | කැබලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු (කැබැල්ලකට) | රු. 200.00 |
| f. | කැබලි සැළසුම් හා අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු | රු. 1000.00 |

| | |
|---|---|
| 17. පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු | රු. 100.00 |
| 18. පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු (පොත් දෙකටම) | රු. 2.00 |
| 19. පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | රු. 25.00 |

**දුරකථන කුලුණු හා විකාශන මධ්‍යස්ථාන සඳහා ගාස්තු**

| | |
|---|---|
| 1. දුරකථන කුලුණු හා විකාශන මධ්‍යස්ථාන වල සැළැස්ම අනුමත කිරීමේදී භූමියේ වර්ග අඩියක් සඳහා අයකරන ගාස්තු | රු. 100.00 |
| 2. කුලුණේ පලමු මීටර් 10 නිදහස් වන අතර ඊට වැඩි වන මීටරයකට | රු. 2 500.00 |
| 3. පරීක්ෂණ ගාස්තු | රු. 1 000.00 |
| 4. වාර්ෂික ව්‍යාපාර බද්ද | රු. 3000.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

## viii. ඉඩම් විකිණීම මත බදු පැනවීම 2023

### යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ නාගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් ප්‍රසිද්ධව වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැවුකරු හෝ ඔහුගේ සේවකයා අනුයෝජිතයා විසින් නාගොඩ ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

## ix. 2023 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබද බද්ද යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ අංක 148 වැනි වගන්ති යටතේ පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනු ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබද බද්දක් 2023 වර්ෂය සඳහා නියම කිරිමට යෝජනා කල බව එකි පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලබන අතර 148 (3) වැනි වගන්තිය යටතේ බදු මුදල 2023 ජුනි මස 30 දිනට පෙර ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛනය**

| | | |
|---|---|---|
| 1 | බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන වාහනයක් සඳහා | - රු. 25.00 |
| 2 | පාපැදිය වෙළඳ කාර්යයක් සඳහා යොද වන්නේ නම් | - රු. 18.00 |
| 3 | පාපැදිය වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | - රු. 4.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**08**.ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරිම 2021 වර්ෂයේ සිදුකරන ලද වලකුඹුර ආදාහනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අත්තිකාරම් සුරක්ෂණය නිදහස් කිරීමේදී රදවා ගන්නා ලද මුදලින් රු.1401517.91 මුදලක් අමාත්‍යාංශය වෙත බැරකල යුතුව ඇත.

එසේ වුවද ආදාහනාගාරයේ ඉතිරි සිවිල් වැඩ හා හදිසි අත්‍යවශ්‍ය කෙටිකාලීනව කලයුතු වැඩ ඉහත රදවා ගන්නා ලද මුදලින් සිදුකිරීමට හැකිබව පෙනීයයි.

එබැවින් රදවා ගන්නා ලද රු.1401517.91 ක මුදලින් ආදාහනාගාරයේ සිවිල් වැඩ සිදුකිරීමටත් ඒ සඳහා ප්‍රජාමූල කොන්ත්‍රාත් සමිතියක් යොදා ගැනීමටත් රදවා ගත් මුදලට වඩා ඇස්තමේන්තු කිරීමේ දී වැඩිවූ රු.138,482.09 ක මුදල සභා අරමුදලින් දැරීමටත් අදාළ අනුමැතිය ලබාදෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු මන්ත්‍රී නෙලී මහත්මිය අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමනි, ප්‍රතිපාදන මුදල් නැවත හරවා යැවීමට වඩා උචිත ලැබුණු ප්‍රතිපාදන මුදල් වලින් යමක් කිරීමයි .එම නිසා එම මුදල් හරවා නොයවා කරන්න පුළුවන් තරමින් ආදාහනාගාරයේ ඉතිරි වැඩ කරමු .

**ගරු සභාපතිතුමා අදහස් ප්‍රකාශ කරමින්**

ඉදිකිරීම් ප්‍රජාමූල සංවිධානයක් හරහා සිදුකර මෙම වර්ෂය එනම් (2022 දෙසැම්බර් 31) දින අවසානවීමට ප්‍රථම බිල්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිනවා.

**ගරු සභාපති - ගරු මන්ත්‍රීවරුනි විරෝධතා තිබේනම් ඉදිරිපත් කරන්න.**

**විරෝධතා කිසිවක් නොමැති බව පෙනී යන හෙයින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පූර්ව ළමාවිය මධ්‍යස්ථාන සම්බන්ධ කර ගනිමින් අප ප්‍රාදේශීය සභාව යටතේ ඇති රු 142,080.00 ක මුදලක් දරුවන්ගේ උදෑසන ආහාරවේල සඳහා වෙන් කර ඇති අතර, එම මුදල ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ප්‍රතිපූර්ණයන්ට යටත්ව ගෙවීමට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. වළකුඹුර ආදාහනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021.08.07 දින දෙල්ගොඩ එම්.එන්.ජී කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඞ් ආයතනය සමග ඇති කර ගත් කොන්ත්‍රාත් ගිවිසුම අහෝසි කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි. (නැවත ප්‍රතිපාදන සපයාගත් පසු ටෙන්ඩර් කර ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කිරීමට බලාපොරොත්තු වෙමි.)

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

11. 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට 2022.11.04 දින මුදල් කමිටුවේදී අනුමත වී ඇත. ඒ සඳහා සභා අනුමැතියට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

12. භාණ්ඩ සමීක්ෂණ සම්බන්ධව 2022.12.31 අවසන් වන වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023.01.03 දින ආරම්භ කල යුතු බැවින්, ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය, නාගොඩ මහජන පුස්තකාලය, මාපලගම මහජන පුස්තකාලය, මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානය, උඩුගම මහජන පුස්තකාලය, උඩුගම උප කාර්යාලය, කොම්පෝස්ට් අංගනය හා පෙර පාසල් 14 හි සමීක්ෂණ කටයුතු සිදු කිරීමට සමීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට අවශ්‍යව ඇත. මේ සඳහා කාර්යාලීය නිලධාරී මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගැනීමටත්, ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් සභිකයන් 3 දෙනෙක් පත් කර ගැනීමටත් ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරන ලදී .**

**ඒ අනුව 2022.12.31 අවසන් වන වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් සභිකයන් 3 දෙනෙක් ලෙස ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා /ගරු මන්ත්‍රීනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය / ගරු මන්ත්‍රීනී ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මිය සුදුසුයැයි ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති එම් .කේ ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

| අනු අංකය | නිළධාරී නම | තනතුර |
|---|---|---|
| 01 | කේ.ජී. මානෙල් සුදර්ශනී මිය | සංවර්ධන නිලධාරී |
| 02 | පී.ඩී. යුරේකා මල්කාන්ති මිය | සංවර්ධන නිලධාරී |
| 03 | නිලන්ති වේරගොඩ මිය | සංවර්ධන නිලධාරී |
| 04 | කේ.ඩී.එස්.නිපුනිකා මිය | සංවර්ධන නිලධාරී |
| 05 | එන්.වී.නිසංසලා දිල්රුක්ෂි මෙය | සංවර්ධන නිලධාරී |
| 06 | ඊ.ආර්.බී.ගුණවර්ධන මිය | සංවර්ධන නිලධාරී |
| 07 | කේ.ජී.අනුෂා කුමාරි මෙය | සංවර්ධන නිලධාරී |

| | | |
|---|---|---|
| 08 | පී.ටී.තරංගා ඉෂාරි මිය | සංවර්ධන නිලධාරී |
| 09 | කේ.පී.ජී.එස්. හේමචන්ද්‍ර මිය | සංවර්ධන නිලධාරී |
| 10 | ධනුෂ්ක සේනාරත්න මයා | සංවර්ධන නිලධාරී |
| 11 | බී.ජී.තිළිණි වාසනා මෙය | සංවර්ධන නිලධාරී |
| 12 | එන්.එච්.ඩී.නිරෝෂනී කාන්ති මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| 13 | කේ.මධුෂානි වාසනා මෙය | කළමනාකරණ සේවා නිලධාරී |
| 14 | රුචිනි චතුරිකා මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| 15 | එම්.ඒ.එන්.ප්‍රබෝධනී මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| 16 | ඩබ්.ජී.අයේෂ් ශානක මයා | ආදායම් පරීක්ෂක |
| 17 | කුසල් එදිරිසිංහ මයා | තාක්ෂණික නිලධාරී |
| 18 | නදුන් ප්‍රමෝද් මයා | තාක්ෂණික නිලධාරී |
| 19 | අනුෂා සමරවික්‍රම මිය | තාක්ෂණික නිලධාරී |
| 20 | ඉෂානි දීපිකා මිය | පරිගණක ක්‍රියාකරු |
| 21 | අවන්ත පද්ම මයා | කාර්යාල කාර්ය සහායක |
| 22 | යූ.වී.මධුර ප්‍රභාත් මයා | කාර්යාල කාර්ය සහායක |
| 23 | චතුරානි පතිනායක මිය | වැඩ ක්ෂෙත්‍ර කම්කරු |
| 24 | සන්ධ්‍යා මල්කාන්ති මිය | වැඩ ක්ෂෙත්‍ර කම්කරු |

**එමෙන්ම, මෙම සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා, ඉහත දක්වා ඇති නිළධාරීන් සහභාගි කර ගැනිමට අපේක්ෂා කරන බැවින්, එම නිළධාරී මණ්ඩලය පත් කිරීමට සුදුසු බව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති එම්.කේ ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

13. ඌරල නැහිනිගල මාර්ගයේ ගමන් කල හැකි වාහනවල බර ප්‍රමානය සභාව මගින් තීරණය කර ලබා දෙන ලෙස යෝජනා කරමි.

**මේ පිළිබඳව RDA කාර්යාලය දැනුවත් කිරීමටත්, ටොන් ප්‍රමාණය සඳහන් කිරම නොකල යුත්තක් ලෙසත් සභාවේ අදහස විය. මේ සම්බන්ධයෙන් ඌරල KDAW ආයතනය දැනුවත් කරන ලෙස වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව සංශෝධිත යෝජනාව එම්. කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

14. රටේ පවත්නා උද්ධමනය හා ආර්ථික තත්වයේ වෙනස්වීම මත සුළු මුදල් බිල්පත්වල දැනට ගෙවන වටිනාකම රු. 300.00 ක මුදල රු. 500.00 දක්වා වැඩි කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

15. කේ.ජී.ඩී.ඩී. සේනාරත්න මයා,සංවර්ධන නිලධාරී ,නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් ඉල්ලුම්කර ඇති හා ප්‍රධානලේකම් ගේ චක්‍රලේඛ (මුදල්) 03-2019 ප්‍රකාරව අනුමත රුපියල්: 6200.00 ක්ෂේත්‍ර දීමනාව ලබාදීම සදහා සහා අනුමැතිය ලබා ගැනීම සදහා සහා අනුමැතියට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**16. ආලෝක විහාරස්ථානය, විදූමුතු පෙර පාසල, උක්ඕවිට**

උක්ඕවිට විදූමුතු පෙර පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය 2022.12.06 දින පැවැත්වීමට තීරණය කර ඇත. එබැවින් මෙහිදී විදුලි ගාස්තු මුදලද ඇතුලත්ව රු. 6000.00 ක මුදලකට යටත්ව උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**17. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**2022.11.09** වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

I. 2022 ඔක්තෝම්බර් මස මන්ත්‍රීවරුන් සදහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත **- රු. 81,000.00**

II. සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා SPPF 7360 අංක දරණ කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම **- රු. 600.00**

**02. චන්දිමා සෙනෙවිරත්න මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව** **- රු. 9,164.66**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **sp/psc/07/01/08(37)** හා 2022.02.07 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් සැප්තැම්බර් මස දීමනා ගෙවීම

**03. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල**

2010 වර්ෂය සඳහා හිඟ විගණන ගාස්තු ගෙවීම **- රු.10,000.00**

**04. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, ගාල්ල** **- රු.7,700.00**

නාගොඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් 2020 ඔක්තෝම්බර් මාසයට අදාළව මුද්දර ගාස්තු උප ලේඛන සකස් කිරීමේ කාර්ය මණ්ඩල දීමනා ගෙවීම

**05. එල්. එස්. ආර්. විජේතිලක, නාගොඩ, ගාල්ල** **- රු. 6,000.00**

නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2022 නොවැම්බර් මස බදු කුලිය ගෙවීම

**06. නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, අංක 24, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල**

I. 2022.03.31 දින 06553 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු -. **-රු. 3,000.00**

II. 2022.06.23 දින 06553 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු **-රු. 3,000.00**

**07. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර, ජාගොඩ කේක් ඇන්ඩ් ස්වීට්ස්, ඉහළ ලේලවල, ගා/ වදුරඹ**

2022.10.11 දින පැවති මහ සභා වාරය සඳහා සංග්‍රහ වියදම් බිල්පත පියවීම **-රු. 14,485.00**

**08. ඒ.කේ නිලන්ති සජීවනී, ග්‍රාෆ්ටෙල් කොමියුනිකේෂන්, යටලමත්ත.**

i. 2022 ඔක්තෝම්බර් මස සභා වාර්තා පිටපත් 28ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු. 3,186.00**

ii. 2022 ඔක්තෝම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා දුරකතන කාඩ්පත් ලබා ගැනීමේ බිල්පත **-රු.28,500.00**

**09. ජයන්ත ඉලේපෙරුමආරච්චි මයා, ජේ.පී.කමියුනිකේෂන්, ගාලු පාර,නාගොඩ** **- රු.17,600.00**

නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ ඇති පුස්තකාල තුන හා පෙරපාසල් සඳහා මුද්‍රිත ලේඛන මිළදී ගැනීම

**10. ඒ.ඩී. කරුණාරත්න, සරත් ස්ටෝර්ස්, යටලමත්ත** **-රු.11,020.00**

2022 ඔක්තෝම්බර් මාසය සඳහා නාගොඩ මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම

**11. ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ**

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත පියවීම 2022 සැප්තැම්බර්** **- රු. 439,100.00**

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2022.09.01 | PF 7360 කැබ්රථය | 370329 | ඩීසල් | 65 | 27,950.00 |
| 2022.09.05 | | 370331 | | 23 | 9,890.00 |
| 2022.09.11 | | 370334 | | 56 | 24,080.00 |
| 2022.09.13 | | 370336 | | 38 | 16,340.00 |
| 2022.09.15 | | 370338 | | 50 | 21,500.00 |
| 2022.09.18 | | 370339 | | 61 | 26,230.00 |
| 2022.09.21 | | 370343 | | 50 | 21,500.00 |
| 2022.09.26 | | 370347 | | 68 | 29,240.00 |
| 2022.09.30 | | 370352 | | 64 | 27,520.00 |
| | | | **එකතුව** | **475** | **204,250.00** |
| 2022.09.01 | 252-6478 කැබ් රථය | 370328 | ඩීසල් | 50 | 21,500.00 |
| 2022.09.12 | | 370335 | | 20 | 8,600.00 |
| 2022.09.19 | | 370341 | | 70 | 30,100.00 |
| 2022.09.26 | | 370348 | | 20 | 8,600.00 |
| | | | **එකතුව** | **160** | **68,800.00** |
| 2022.09.02 | LL 7650 කෘ කැබ් රථය | 370330 | ඩීසල් | 30 | 12,900.00 |
| 2022.09.11 | | 370333 | | 30 | 12,900.00 |
| 2022.09.19 | | 370340 | | 30 | 12,900.00 |
| 2022.09.26 | | 370346 | | 20 | 8,600.00 |
| | | | **එකතුව** | **110** | **47,300.00** |
| 2022.09.21 | LL 7366 | 370344 | ඩීසල් | 40 | 17,200.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2022.09.28 | ට්‍රක් ජල බවුසරය | 370350 | | 50 | 21,500.00 |
| | | | **එකතුව** | **90** | **38,700.00** |
| 2022.09.15 | SPRA 8570 ට්‍රැක්ටරය | 370337 | ඩීසල් | 20 | 8,600.00 |
| 2022.09.19 | | 370342 | | 40 | 17,200.00 |
| 2022.09.25 | | 370345 | | 30 | 12,900.00 |
| 2022.09.28 | | 370351 | | 30 | 12,900.00 |
| | | | **එකතුව** | **120** | **51,600.00** |
| 2022.09.27 | **LL 7103** ටිපර් රථය | 370349 | ඩීසල් | 40 | 17,200.00 |
| | | | **එකතුව** | **40** | **17,200.00** |
| 2022.09.07 | ගබඩා කර තබා ගැනීම සඳහා | 370332 | පෙට්‍රල් | 25 | 11,250.00 |
| | | | **එකතුව** | **25** | **11,250.00** |
| | | | **මුළු එකතුව** | **647** | **439,100.00** |

**12. එච්. එල්. කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, සමගිගම, උඩුගම දකුණ, ගා/උඩුගම**

2022 ඔක්තෝම්බර් මාසය තුළ දී උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු. 9,570.00**

**13. ඩී.ආර්. ශ්‍යාමන් සෝමසිරි මයා, ශ්‍රී ලංකා ගමණාගමන මණ්ඩලය, ගාල්ල**

252-6478 අංක දරන කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධයෙන් පරික්ෂා කර බලා පෙර වාර්තාව ලබා දීම වෙනුවෙන් ගෙවීම **- රු. 500.00**

**14. ඊ.ඒ. සමන් කුමාර මයා, එදිරිසිංහ මෝටර්ස්, දහවල්හේන පාර,කුරුන්ද, උඩුගම** **රු. 6,250.00**

LL 7650 කෘ කැබ් රථයේ ෆැන් බෙල්ට් එක සහ පවර් බෙල්ට් එක අලුතින් දමා සවි කිරීමේ බිල්පත පියවීම

**15. කැළුම් පුෂ්පකුමාර මයා, උඩුගම මෝටර්ස් ඉංජිනියර්ස්,කෙලින් වීදිය, උඩුගම**

I. RA 8570 ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියාව සම්බන්ධ බිල්පත පියවීම **- රු. 6,750.00**

II. RA 8570 ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් බිල්පත පියවීම **- රු. 2,200.00**
( දකුණු පස මඩ්ගාඩ් එක ගලවා දිරා ගිය කොටස් ඉවත් කර අලුතින් සාදා පාස්සා සවි කිරීමට අදාළ බිල්පත)

**16. ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් එටෝ සර්විස්, ඇතුමලේ, ගාල්ල** **-රු.1,105.00**

SPPF 7360 අංක දරණ කැබ් රථය සඳහා හෙඩ් ලයිට් බල්බය හා පාකින් බල්බය දැමීමේ බිල්පත පියවීම

**17. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම 2022 ඔක්තෝම්බර් **- රු. 14,500.00**

**18. <u>සේවක ණය</u>**

**දස මස වැටුප් අත්තිකාරම් මුදල් ලබා ගැනීම**

ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා - මුරකරු **- රු. 250,000.00**

**19. <u>2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

I. මානෙල් සුදර්ශනී මිය - සංවර්ධන නිලධාරී **- රු. 6,200.00**

II. කේ.ඩී.එස්.නිපුනිකා මිය - සංවර්ධන නිලධාරී - **රු. 6,200.00**
III. ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරික්ෂක - **රු. 4,000.00**

**20. <u>2022 නොවැම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

I. ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරික්ෂක - **රු. 650.00**

**<u>පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම</u>**

I. නිලන්ති වේරගොඩ මිය - සංවර්ධන නිලධාරී - **රු.2,616.00**
II. කේ.ඩී.එස්.නිපුනිකා මිය - සංවර්ධන නිලධාරී - **රු.2,400.00**

**<u>2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

I. නිමල් වික්ටර් නාගොඩවිතාන මයා - ගරු සභාපති - **රු.1,000.00**
II. කේ.ජී.ජී.ඩී. සේනාරත්න මයා - සංවර්ධන නිලධාරී - **රු. 700.00**

III. එම්. ඒ. වසන්ත මයා -රියදුරු - **රු. 4,200.00**
IV. කේ.එච්.එම්. කැළුම් චාමර මයා - රියදුරු - **රු. 700.00**

**21. <u>අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2022 සැප්තැම්බර් මස</u>**

ඒ.එච්.ජී. සංජීව මයා - කම්කරු - **රු. 4,703.00**

**<u>2022 ඔක්තෝම්බර් මස</u>**

**I.** එම්.ඒ.වසන්ත මයා - රියදුරු - **රු. 9,226.00**
II. කේ.එච්.එම් කැලුම් චාමර මයා - රියදුරු - **රු. 4,066.00**
III. කේ. එච්.එම් නිශාන්ත ඉඳුනිල් - රියදුරු - **රු. 8,560.00**
IV. ඩී.ටී.ආර්.ඒ. තරිඳු ගුණරත්න මයා - මුරකරු - **රු. 5,751.00**
**V.** ඩබ්.කේ. සම්පත් සංජීව මයා - අනියම් රියදුරු - **රු. 7,490.00**
VI. එන්.එම්.රජිත් මයා - අනියම් මුරකරු - **රු. 4,191.00**
VII. යූ.ජී.රංජිත් උදය කුමාර මයා - වැඩ/ක්ෂේත්‍ර කම්කරු - **රු. 5,958.00**
**VIII.** අයි.කේ.ඉන්දික මයා - වැඩ/ක්ෂේත්‍ර කම්කරු - **රු. 1,627.00**
**IX.** ඒ.එච්.ජී. සංජීව මයා - කම්කරු - **රු 3,609.00**
X. කේ.ජී.හර්ෂ චාමර සම්පත් මයා - සෞඛ්‍ය කම්කරු - **රු. 8,080.00**
XI. එම්.ඩබ්ලිව්.හර්ෂ කුමාර මයා - සෞඛ්‍ය කම්කරු - **රු. 1,391.00**
**XII.** එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා - විදුලි කාර්මික - **රු. 525.00**
XIII. යූ.ජී. ආසිරි අභය කුමාර මයා - සෞඛ්‍ය කම්කරු - **රු. 4,848.00**

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් අංක 1 – 21 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

i. කොස්ගහ බංගලාව පාර ඔස්සේ ගලා යන ජලය ක්‍රමවත් පරිදි බැහැර කිරීම - රු. 90,000.00

ii. හෝමදොළ පාසල අසළ මාර්ගය සුජාතා මහත්මියගේ නිවස දක්වා ජේ.සී.බී කිරීම - රු. 60,000.00

iii. නෙළුවැල් මූකලාන මාර්ගය ජේසීබී කිරීම - රු. 45,000.00

iv. RD 1637 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම සඳහා - රු. 139,100.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසෙකර මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

(ඉ) 4. මිළ ගණන් ඉදිරිපත් කිරීම

**(ඊ) කාරක සභා වාර්තා**

01.2022.10.25 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව

02.2022.11.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව

**ඉහත සඳහන් මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සත්‍ය වාර්තා ලෙස ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

01. 2022 ඔක්තෝම්බර් ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභාගත කරන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

**ගරු සභාපතිතුමා**

ආදාහනාගාරයේ ණය පිලිබඳවත්, සභාවේ ආදායම් තත්ත්වය පිළිබඳවත් කතා කිරීම සඳහා අපේ සහකාර කොමසාරිස්තුමා, මංජුල මහත්මයා ආදාහනාගාරයේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ණය ලබා ගැනීමට අදාල බල ප්‍රදේශයේ කටයුතු කරන දේශීය ණය නිලධාරීතුමියටත් ආරාධනා කළා. නමුත් එතුමිය අද දින පැමිණිලා නැහැ. ඒ එක්කම අපි ඔබතුමාලට දැනුම් දීලා ඇති අපේ න්‍යාය පත්‍රයට වෙනත් කරුණු යටතේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපණම් කටයුතු එකතු කිරීම සහ වලකුඹුර ආදාහනාගාරයේ ඉතිරි වැඩ කටයුතු කිරීම සඳහා ණය මුදලක් ලබා ගැනීම සම්බන්ධව සාකච්ඡා කිරීමට. පළාත් පාලන කොමසාරිස්තුමාගේ පැමිණීම සම්බන්ධව. සහකාර කොමසාරිස්තුමා පැමිණ සිටිනවා. එම නිසා අපි මෙම මහා සභාව කාරක සභාවක් හැටියට පත් කරමු. සහකාර කොමසාරිස්තුමාට මම මෙම සභා ගර්භයට පැමිණෙන ලෙස මම ආරාධනා කර සිටිනවා.

**2022.11.09 දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීම මෙතැන් සිට විශේෂ කාරක සභා රැස්වීමක් ලෙස පැවැත්වීමට සුදුසු යැයි ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර, ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපතිතුමා**

වරිපනම් බදු කටයුතු අපට කරගන්න බැරි වුණා. අපට ලබාදිය යුතු සේවා තත්ත්වයක් ලබා දීමට නොහැකි වූ නිසා, අපේ නොදැනුවත්භාවය නිසා දිගින් දිගටම අපේ ආදායම් තත්වය අඩු වුනා. අපේ සභාව අඩු ආදායම්ලාභී සභාවක් ලෙස තමයි පෙළ ගැහිලා තියෙන්නේ. ඒක අපේ විතරක් වැරැද්දක් නෙවෙයි. පෙර සිට ආපු තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපට ආදායම් ලබා ගැනීමේ හා ආදායම් උත්පාදනය කර ගැනීමේ හැකියාව අල්පයි. අපේ සභාව සතු ආදායම් ලැබෙන ස්ථාන අඩුයි. ඒ නිසා තමයි අපි ඒ තත්ත්වයට පත්වුණේ. නිතරම අපි මුද්දර ගාස්තුවලින් යැපුන සභාවක් හැටියට වර්තමානයේ අපට බදු වලින් පමණක් ගෙනියන්න බැහැ. වෙන වෙන ආදායම් තත්ව ඇති කර ගැනීම සඳහා අපි උත්සාහ ගත්තා. නමුත් මෙම වර්තමාන කාල වකවානුව තුළ, මේ අවුරුදු හතර පහ තුළ යම් යම් ගැටලුකාරී තත්ත්ව නිසා එය  අපට යථාර්ථයක් බවට පත් කර ගන්න බැරිවුණා. එම හේතුවෙන් මම සභාපති හැටියටත් අපහාසුතාවයට පත් වෙනවා. විශේෂයෙන් අදත් සභාවේ කතා වුනේ, අපේ උනන්දුව පිට අත්‍යවශ්‍යම සේවාවක් වන ආදාහනාගාරය සකස් කිරීම සම්බන්ධවයි. අපේ නිලධාරීන්, දෙපාර්තමේන්තුත්, අමාත්‍යාංශ, ඒ වගේම අපේ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා උනන්දු වෙලා තමයි අපේ ඒ කටයුත්ත කළේ. ඒ වගේම අපට වෙළෙඳ සංකීර්ණයේ වැඩ කටයුතුත්  අතරමග නතර වෙලා තියෙන්නෙ. ඉතින් මේ වන විට අපි ණය ඉල්ලීමක් කරන්න බලාපොරොත්තු වෙන්නෙ. නමුත් ණය ගත්ත වගේම ණය ගෙවීම සිද්ධ කරන්න ඕන. ඉතින් ඒකටත් අපට හැකියාවක් නැත්තේ නොයෙක් අපහසුතා මැද මේ සභාව ගන යන නිසා.

මගේ අදහස ඒකක්. ඒ වගේම  ඒක් ඒක් මන්ත්‍රීවරුන්ගේ අදහස් විවිධාකාරයි. හැබැයි සියලු මන්ත්‍රීවරුන්ගේ අදහස් තියෙන්නෙ අමාරුවෙ නොවැටී සභාව ගොඩනගන්න. ඒ සම්බන්ධයෙන් අපව දැනුවත් කිරීම කරන්න කියලා ප්‍රකාශ කළාට පස්සෙ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉන්නේ ප්‍රධාන දක්ෂ නිලධාරීන් ඒ පිළිබඳව ඉස්සර ඉඳලම මට උපදෙස් දෙනවා. නමුත් මට යථාර්ථයක් බවට පත් කර ගන්න බැරි වුණා. මේ පිලිබඳවත්, නීතිය පිළිබඳවත්, ආදායම් උත්පාදනය කරගන්න ක්‍රමවේද, අනෙක් සභා වලට උපදෙස් දෙන උපදේශකයෙක් ලෙසත් කටයුතු කරමින් අපේ සහකාර කොමසාරිස් මංජුල මහත්මයා මේ සභාවට පැමිණිලා තියෙනවා.  අපගේ අවශ්‍යතාවයන් පිළිබඳව ඔබගේ දැනුවත් භාවය අපට දෙන්න කියලා ඔබතුමාට ආරාධනා කරනවා.

**සහකාර කොමසාරිස්තුමා**

සුභ සන්ධ්‍යාවක් කියලා සියලු දෙනාටම සුභ පතනවා. අර සභාපතිතුමා කිව්ව වගේ කොමසාරිස්තුමාත් මමත්, පසුගිය සතියේ සභාපතිතුමාගේ ඉල්ලීමක් මත අපි සභාවට ආවා. එසේ ඇවිල්ලා අපි නිලධාරීන් එක්කත් කතා කළා. ඒ වගේම බල ප්‍රදේශයේ විවිධ ස්ථාන නිරීක්ෂණයට ගියා. ඒකෙදි අපට අනාවරණය වූ කරුණුත් එක්ක, අපි සභාපතිතුමා සමග කතා කලාම, අපිට තේරුන දේ තමයි සභාවේ ආදායම සම්බන්ධව තියෙන පසුබෑම. මෙහි තිබෙන ඊලගම බරපතළ ප්‍රශ්නය තමයි ඉදිරියේදී මොකද වෙන්නේ කියන තත්වය. සභාවේ පුනරාවර්තන වියදම් ටික එන්න එන්නම වැඩි වෙනවා. නමුත් ඒ එක්කම සභාවේ ආදායමත් එන්න එන්නම අඩු වෙනවා. ඇයි මම එහෙම කියන්නේ? ඔබතුමාලම දන්නවා ඇති. මෙහේ විතරක් නෙවෙයි. අපේ දකුණු පළාතේ තියෙනවා පළාත් පාලන ආයතන 49 ක්. ඒ 49 ටම තියෙන්නෙ මේ තත්ත්වය, උදාහරණ ලෙස නාගොඩ සභාව ගමු. අපි වැඩිපුර යැපෙන්නේ පොල් ආදායමත් සමඟ. පොලේ ආදායම එන්න එන්න අඩුවෙමින් පවතිනවා. මොකද අතීතයේ මාසයට දින හතරක් සතිපොළට යන්න අපි පුරුදු වෙලා සිටියා. නමුත් දැන් හැම තැනකම කඩ ඉදි වෙලා තියෙනවා. ඒ වලින් ඕනෑම භාණ්ඩයක් ගන්න හැකියාව මිනිස්සුන්ට ඇතිවෙලා තියෙනවා. අපිට ඒවා පාලනය කරන්න බැහැ. පොළට වෙළෙන්දෝ එන්නේ නැහැ. ඒ නිසා පොලේ ටෙන්ඩර් එක එන්න එන්න අඩු

වෙනවා. සමහරවිට තවත් කල් යද්දී තවදුරටත් පහළට යාවි. පොල කියන සංකල්පය දැන් පහලට වැටිල තියෙන්නෙ. ආණ්ඩුවේ මොන දේශපාලන පක්ෂය ආවත් ඕක තමයි  යථාර්ථය. මෙහෙම ගියොත් පළාත් පාලන ආයතනයට එන ප්‍රතිපාදන අඩු වෙන්න පුළුවන්. දැන් අපට ඔය මුද්දර ගාස්තු ටිකෙන් තමයි යැපෙන්න වෙලා තියෙන්නෙ. සාමාන්‍ය පුනරාවර්තන වියදම් ටිකවත් නඩත්තු කරගෙන යන්න බැහැ. ප්‍රතිපාදන 100% ක් ලැබෙන නමුත් මේ පළාත් පාලන පද්ධතියම හදලා තියෙන්නේ ස්වයං උත්පාදන ආදායම් එක්ක යැපෙන්න. ප්‍රතිපාදන ලෙස මොනයම් හෝ හේතුවකට මධ්‍ය රජයෙන් නිලධාරී වැටුප් සහ දීමනා ටික ලැබෙනවා. දකුණු පළාත ගත්තත්, නමුත් කිසියම් වෙලාවක හරි කියනවනම් වැටුප් සඳහා ෙගවන්න මුදල් නැහැ කියලා,  පසුගිය දිනකදිත් ඒවැනිම සිද්ධියක් සිදු වුණා. පළාත් සභාවෙන් විශාල වෑයමක් අරගෙන තමයි අපි ඒ මුදල් ලබාගත්තෙ. හදිසියෙවත් නිලධාරීන්ගේ සල්ලි අපි ගෙවන්නේ 50% කියලා කිව්වොත්, නැත්නම් තවත් අඩු වුණොත්, මොකද්ද අපට වන තත්ත්වය. ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුනි, අපි අවධානය යොමු කරන්න ඕන අන්න ඒ කාරණාවලට. දැන් ආණ්ඩුවත් බදු ගහනවා. මේ අය කරන බදු ආදායමෙන් මේ මිනිස්සුන්ට ප්‍රතිලාභයක් ලැබෙන පරිදි කටයුතු කළ යුතු වෙනවා. නමුත් අපි ජනතාවගෙන් බදු අය කරනවා. නමුත් ජනතාවට කරන ප්‍රතිලාභයක් පේන්න නැහැ. එක්තරා ආයතනයක් එක් ප්‍රදේශයකින් වරිපනම් බදු එකතු කරලා, වෙනත් ප්‍රදේශයක සංවර්ධන කටයුතු කලහම මිනිස්සු සතුටු වෙන්නෙ නැහැනෙ. සභාපතිතුමා මීට අමතරව පනතේ 134 - 4 වගන්තියෙ තියෙනවා දරිද්‍රතාවය මත වතුත් ලැයින් කාමර වැනි අඩු ආදායම්ලාභීන් නිදහස් කරමු කියලා. ණයක් දෙකක් ඒක යන ක්‍රමයක් තියෙනවා. කොහොමද යෝජනාවක් ගන්නේ. ඒක නිලධාරිනුත් දන්නවා. ඒ ගැන පොඩ්ඩක් සලකලා බලලා, දියුණු ගම් ප්‍රදේශ කියන සංකල්පය. ඊට පස්සේ ඒක තමයි වරිපනම් බදු අය කරන එක. වරිපනම් බදු අය කරන එකත් ලොකු ගානකට යන්න ඕන නැහැ. පොඩි ගාණකින් පටන් ගෙන ඉහලට යන විට, දියුණු ගම් ප්‍රදේශ අඩු නම් ඒ රේට් එකත් තව අඩු කරන්න පුළුවන්. චුට්ටක් ඒ ගැන හිතන්න කියන එක තමයි මගේ අදහස. ඒ සම්බන්ධව ඔබතුමාගේ අදහසක් තියෙනවද?

හික්කඩුව නගර සභාවේ යන්න බැරිම තත්ත්වයක් උදාවෙලා තිබුනෙ. හැමෝම හිතන් ඉන්නවා හික්කඩුව නගර සභාව මහ ගොඩක් සල්ලි හම්බවෙන ටුවරිසම් එකක් කියලා. සංචාරකයින් අඩු වුනහම ආදායම් තත්වය අඩු වූ නිසා සභාවෙ අනියම් ආදේශකයන්ටවත් ගෙවාගන්න බැරි වුණා. අන්තිමට අපි කිව්වා. දවස් තුන හතරකට සභාවෙ කුනු ලොරි  බල ප්‍රදේශයෙන් පිට ප්‍රදේශවලටත් යවලා, ආදායම එකතු කරගන්න කියලා.  වීථි පහන් අක්‍රීය වූ ගමන් ඒවා දාන්න එපා. පුළුවන් තරම් වියදම් ප්‍රමාණය අඩු කරගන්න කියලා. ඒවගේම අනියම් ආදේශක සේවකයන් අඩු කරන්න. නමුත් අනියම් සේවකයන් එහෙම එක පාරටම අඩු කරන්න එපා. මොකද ඒ මිනිස්සුත් යම් විදිහකට ජීවන රටාවකට හුරු වෙලා ඉන්නේ. අන්න ඒ මට්ටමට වැටුන හික්කඩුව මහා නගර සභාව තාමත් එහෙමමයි. දැන් හරි අමාරුයි. තවමත් ටුවරිසම් හරි ගිහිල්ලා නෑ. අපි අලුතින් හිතලා යම් දෙයක් කරන්න ඕන. වරිපනම් කියන එක එක කාරණයක් විතරයි. දියුණු ගම් ප්‍රදේශ බවට පත් කිරීම. කිසිදු සංවර්ධනයක් නොමැති පළාත් පාලන ආයතන තමයි අපේ හිනිදුම සීට් එකේම නෙළුව, තවලම, නාගොඩ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා යක්කලමුල්ල මේ ලඟකදි වෙනස් කර ගත්තා. හැබැයි ඇත්තටම අපේ සංවර්ධන ප්‍රදේශයක් නැද්ද? ඇත්තටම උඩුගම කියන්නේ සංවර්ධිත ප්‍රදේශයක්, ගරු මන්ත්‍රීතුමන්ලා පැහැදිලිවම මෙන්න මේ නිර්ණායක ටික තියෙන ප්‍රදේශ තමයි, උදාහරණ විදිහට විදුලිය, ජලය, මාර්ග පහසුකම් ටික තියෙනවා නම්, ඊට පස්සේ ක්‍රීඩාංගන, පුස්තකාල, පාසල්, රජයේ කාර්යාල, කසල අදින කටයුතු, වීදි පහන්, ආදී කටයුතු යම්කිසි මට්ටමකින් තියෙනවා නම්, ඒවා අපි සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ගන්න පුළුවන්. මේ පහසුකම් තියෙනවද කියලා හඳුනා ගැනීම තමයි කරන්න ඕන. හිතන්න, මේවායින් එකක් නැති වෙන්නත් පුළුවන්. නමුත් අපි ඒවා ටිකෙන් ටික හදාගෙන මේ කටයුතු කරන්න බලමු.  අපේ බල ප්‍රදේශයේ කිසිදු සංවර්ධනයක් වෙන්නෙ නැහැ. ඇත්තටම අපට ඒක කියන්නත් ලැජ්ජයි. මම ඒ කිව්ව මොකුත් නෑ වගේ තේරෙන්නේ. නෙලුවත් එහෙමයි. තවලමත් එහෙමයි. නිසි ප්‍රදේශ ලෙස හඳුනගමු, ඊළඟට අපට තියෙන්නෙ, දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම. අපට පේන දේ තමයි නාගොඩ ටවුන් එක සහ තල්ගස්වල ටවුන් එක ටිකක් දියුණු මට්ටමක තියෙන ප්‍රදේශ, ඒ උනාට උඩුගම කියන්නේ අහසට පොළොව වගේ. රජයේ කාර්යාල තියෙනවා. ක්‍රීඩා පිට්ටනි තියෙනවා. අපේ පොළ

තියෙනවා. පාරවල් හොඳට හදලා තියෙනවා. වීථි පහන්, කසල නිසි ලෙස බැහැර කිරීම්, පුස්තකාල, ආදී පහසුකම් තියෙනවා. ග්‍රාම නිලධාරී වසම් දෙකක් ගත්තම අපට පේනවා නම්, වරිපනම් බදු අය කර ගත නොහැකි කොටසක් තියෙනවා කියලා, ඒ ටික නිදහස් කරලා දාන්න පුළුවන්. පනතෙම තියෙනවා දරිද්‍රතාවය මත වරිපනම් බදු අය කිරීමෙන් නිදහස් කල හැකි බව, පොඩි කාරණයක් දෙකක් ටච් කරගෙන සමස්ත කාරණයම ඉවත දාන්න එපා සභාපතිතුමා. පොළවල් ටිකෙන් තමයි දැනට සභාවට ආදායම් ලැබෙන්නෙ. ඉදිරියට ඔක්කොම ටික වැටිලා යනවා. ඉදිරියේදී පොළවල් නැතිම වෙන්න පුළුවන්. දැන් අපට මුද්දර ගාස්තු ටිකෙන් තමයි යම්කිසි දුරකට සභාව පවත්වාගෙන යන්න පුළුවන් වෙලා තියෙන්නෙ. නමුත් ඒ ටිකත් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. දැන් ඒක යන ක්‍රමවේදයක් තියෙනවා. ඒ සම්බන්ධව නීතිමය තත්ත්වය නිලධාරිනුත් දන්නවා. ඒ ක්‍රමවේදයට ගිහිල්ලා ඊට පස්සේ තමයි වරිපනම් බදු අය කරන්නේ. වරිපනම් බදු අය කරන එකත් අපි ලොකු ගානකට යන්න ඕනෙ නැහැ. පොඩි ගාණකින් පටන් ගෙන, එහෙම සලකලා බලලා, ඉදිරියට යන විට දියුණු බව අඩු නම්, අපට ඒ රේට් එක තවත් අඩු කරන්න පුළුවන්. ඔබතුමාලා අදහසක් පළ කරනවා නම්, ඒ ගැන පොඩ්ඩක් හිතන්න.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

සහකාර කොමසාරිස්තුමා, ඔබතුමා ප්‍රකාශ කළා වගේ, වරිපනම් අය කරන්න, අපි බල ප්‍රදේශය කරගත්තෙ උඩුගම ප්‍රදේශය. අනිත් නගරත් එක්ක බැලුවම, මෙහි තියෙන දියුණු නගරයක් හැටියට උඩුගම යෝජනා වුණා. පාර දෙපැත්තෙන් මීටර් සීයක් වරිපණම් බදු අය කරන්න. ඒ සම්බන්ධව එකිනෙක මතිමතාන්තර ඇති වුණා. මෙවැනි දැනුවත් කිරීමක් නැති නිසා ඒ කාර්යය සිදු නොවී යට ගැහුණා. වරිපනම් බදු අය නොකරන නිසා තමයි ණය බ්‍රේක් වුනේ. මේක විය යුතු දෙයක්.

**සහකාර කොමසාරිස්තුමා**

අපි දියුණු ගම් ප්‍රදේශ ප්‍රකාශයට පත් කළ පමණින්ම, ඊළඟට අපට ඊලග ස්ටෙප් එකක් විදියට, වරිපනම් පැත්තට යන්න පුළුවන්. අපි උඩුගමින් වරිපනම් එකතු කරනවනම්, එම ප්‍රදේශයට සංවර්ධනයට යමක් කල යුතු වෙනවා. අපි දැන් නාගොඩ හරියෙන් වරිපනම් අය කරනවා නම්, ඒ පහසුකම් ඒ ප්‍රදේශයටත් දෙන්න ඕන. එක් ප්‍රදේශයක වරප්‍රසාද තවත් ප්‍රදේශයකට දෙනවනම්, එච්චර ගැලපෙන්නෙ නැහැ. සමහර රටවල්වල ආදායමෙන් 55% ක් බදු අය කරනවා. හැබැයි අකමැත්තක් නැහැ. ඒ බල ප්‍රදේශ වල වරප්‍රසාද ටික සියල්ල ජනතාවට ලැබෙනවා. අපේ ඒ විදියට හැදිලා නැහැ. සල්ලි ටික වෙන දේකට වියදම් කරනවා. සභාපතිතුමා, අපි ගිහිල්ලා බැලුවම, පුරනැගුමෙන් හදපු ගොඩනැගිල්ල කඩා වැටෙන තත්ත්වයට පත්වෙලා තියෙන්නෙ. සභාපතිතුමාත් එක්ක කතා කරනකොට, ඇත්තටම මෙතුමා කියන්නේ සභාවේ සල්ලි නැහැ කියලා. අපි හැම පැත්තම හිතන්න වෙනවා. ඒක තමයි මම කිව්වේ වරිපනම් කියන එක එක පැත්තක් විතරක්. ඒක අපට ක්ෂණිකව කරන්න බැහැ. ග්‍රාම නිලධාරීන් හා මන්ත්‍රීවරුන් සම්බන්ධ කර ගෙන වසම් ටික ගත්තම, එතකොට අපට ලොකුවට සැළසුම් අඳින්න දෙයක් නැහැ.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා අදහස් ප්‍රකාශ කරමින්**

අපි කතා කලේ ආදායම් උත්පාදනය සම්බන්ධව 2018 වර්ෂයේ මුල් කාලයේ. අපි දැක්කා මේ කාලවකවානුවේ ආදායම සම්බන්ධයෙන් අපි දුර්වල මට්ටමක ඉන්නේ. නමුත් අපි හැමදාමත් උඩුගම තමයි සභා බල ප්‍රදේශය තුල කේන්ද්‍රීය ආර්ථික මධ්‍යස්ථානය ලෙස සලකන්නෙ. වරිපනම් අය කළත්, අපේ ප්‍රදේශ විතරක් නෙවෙයි අනිකුත් ප්‍රදේශවලිනුත්වරිපනම් අය කල යුතු වෙනවා. ලයිට් තියෙනවා. වතුර තියෙනවා. සමහර මිනිස්සු ඉන්නවා. කැමැත්තෙන් වරිපනම් ගෙවන්න. නමුත් ඒක අපට ක්‍රියාත්මක කරගන්න බැරි වුනා. ඊට අමතරව අපේ ප්‍රාදේශීය සභාවට අයිති උඩුගම හොඳ ස්ථාන තියෙනවා. පොළ පරණ තැන්වල ඉඳලා වෙන තැනකට ගන්න. ඒ කොටසේ අපට පුළුවන් වෙළෙඳ සංකීර්ණයක් හදන්න. අපට සත පහක් වත් වියදම් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද කඩකාමර හදන්න මේ ව්‍යාපාරික ප්‍රජාව මුදල් දෙනවා. අනිවාර්යෙන් ලක්ෂ 12 ක් හොයන්න පුළුවන්. එතකොට

තියෙනවා එම ස්ථානයේ, පෙරපාසල, නාගොඩ පාරත් ගෝණදෙනිය පාරත් අසළ කඩ කාමර ගහලා බදු දීලා තියෙනවා. මොන්ටිසෝරිය උඩට ගෙහිල්ලා, කඩ කාමර පෙළක් ගහලා, ඒක බදු දෙන්න පුළුවන්. ඇප්තොප්වත්ත කියන්නේ සභාපතිතුමාගේ කාලේ තමයි අපට නීත්‍යානුකූලවම හිමි වුණේ. එක පැත්තක බැලුවොත් කාබනික පොහොර සම්බන්ධව ව්‍යාපෘතියකුත් කර ගෙන යනවා. නමුත් අපට තවම බැරි වුණා ගුණාත්මකභාවයෙන් යුතු පොහොර නිෂ්පාදනයක් ඇති කරන්න. අපි ඒ සම්බන්ධව යම් යම් යෝජනා කලා, ප්‍රතිපාදන නොමැති නිසා ක්‍රියාත්මක නොවන්න ඇති. කාබනික පොහොර නිෂ්පාදනය කරන්න පුළුවන් නම් සභාවට මීට වඩා ආදායමක් හොයාගන්න පුළුවන් වේවි. ඊට අමතරව ඇප්තොප්වත්තෙ අක්කර පහ හයක් තියෙනවා. අපට සත්ව ගොවිපලක් පවත්වාගෙන යන්න පුළුවන්. එහෙම නැත්නම්, උඩුගම ප්‍රදේශය මුල් කරගෙන, මහා දැවැන්ත ව්‍යාපෘති කරන්න පුළුවන් හැකියාව තියෙනවා. මම හිතනවා අද ඔබතුමාගේ පැමිණීමෙන්, ඉදිරි 2023 වර්ෂයවත් ආදායම් උත්පාදන වර්ෂයක් ලෙස හඳුන්වමින්, සැලසුම් සහගතව මේ තීරණ ක්‍රියාත්මක වෙයි කියලා. ඒ වගේම පඩිපෙලින් පඩිපෙළ මෙන්න මේ දේවල් වෙන්න ඕන කියනවා. නමුත් අපි හැමදාම මේ පිළිබඳව කතා කරලා සභා වාර්තාව පුරවල යනවට වඩා අපි මෙතනින් යනකොට යම්කිසි ආදායම් උත්පාදනයක් කරලා, යම්කිසි තැනකට ගෙනැල්ල යන්න තමයි අපිත් කැමති. ඉතින් ඒක නිසා ඔබතුමත් මූලිකත්වය ලබා දෙන්න. ඕනෑම වැඩපිළිවෙලකට පක්ෂ භේදයකින් තොරව ගරු සභාපතිතුමාට සම්පූර්ණ සහයෝගය ලබාදෙනවා. ඒ නිසා මම හිතනවා මූලික අදියර විශේෂයෙන් උඩුගම ප්‍රදේශය පාදක කරගෙන, යම්කිසි සැලැස්මකට ආදායම උත්පාදනය ලෙස හඳුනාගෙන, කරගන්න පුළුවන් ඒවට මූලිකත්වය දෙමින්, වැඩසටහනක් හදලා, ඔබතුමා මැදිහත්වීමෙන් කටයුතු කරලා, ඔබතුමා ඒ සැලැස්ම හදලා උදව් කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් ප්‍රකාශ කරමින්**

ඇත්තටම වරිපනම් කියන්නේ එක පැත්තක් විතරයි. ඔබතුමා කියනවා වගේ එහෙම යන්න කාලයක් නැහැ. ඒක නිසා දැන් මේ වැඩ ටික ඔක්කොම එකට පටන් ගන්න වෙනවා. ලේකම්තුමිය, ඒකට අපට නිලධාරීන්ගේ සහයෝගය ඕන වෙනවා. නැතිව මේක කරන්න බෑ සභාපතිතුමාටවත්, මහා සභාවේ තීන්දු තීරණ ඔබතුමාලා ගන්නවා. ඒ තීරණ සභාපතිතුමා ලවා ක්‍රියාත්මක වෙන්න ඕන. එතකොට සභාපතිතුමාට සහයෝගය තියෙන්න ඕන. එතකොට එක වගේ යන්නත් බැහැ. ඒ වගේම එකක් ඉවර වුනහම තව එකකට යන්නත් බැහැ. දැන් අපිට එකතු වෙලා වැඩ කරන්න ඕන. එහෙම නැතුව බැහැ. ඒ නිසා කලින් දාපු යෝජනාව නැවත සභාවට අරගෙන, ඒක ගැන පොඩ්ඩක් නැවත අවධානය යොමු කරන්න. සහකාර කොමසාරිස් කාර්යාලය පැත්තෙන් දෙන්න ඕන සහයෝගය අපි නිරන්තරයෙන් ම දෙනවා. සභාපතිතුමා ඇවිල්ලා නිතරම අපිත් එක්ක කතා කරනවා. එතුමා කියපු වෙළඳ සංකීර්ණය සම්බන්ධ කාරනාවෙදි එම වෙළද සංකීර්ණය මහල් 2 කින් යුක්ත නිසා අපි කිව්වේ මේක හදන්න සභාවට සල්ලිත් නැති නිසා, සුදුසු බදු කාරයෙකුට අපි ටෙන්ඩර් කරලා දෙනවා. ඒ කියන්නේ අපි ගන්නවා ජ්ලෑන් එක ටෙන්ඩර් ගන්නවා. හැබැයි සභාව මේක තීරණය කරලා කියන්න ඕන. අපි හිතනවා, උදාහරනයක් ලෙස හික්කඩුව නගර සභාව තීරණය කරලා තිබුණා ආපනශාලාවක් හදන්න. අපේ අරමුණ මේකයි. ඔය ගොල්ලො ටෙන්ඩර් ඉදිරිපත් කරලා, මෙන්න මේක සැලැස්ම හදන්න. එතකොට අපට සතපහක්වත් ඕනෙ නැහැ සභාපතිතුමා. ඔබතුමා කියන හරියේ ඉඩමක් තියෙනවා නම් අපට දෙන්න කියලා. එතකොට ඉක්මන් කිරීම් එක්ක ඒගොල්ලන්ම හදනවා. ඒගොල්ලන්ට කියනවා අපි මෙන්න මෙහෙම වෙළඳ සංකීරණයක් ගහන්න යනවා. අපට එක්වන් මුදල් දෙන්න. සමහර සභා ඉස්සර ඉඳලා කරලා තියෙනවා. අතරමග නවත්තලා තියෙනවා. මිනිස්සු අපට විරුද්ධව නඩුත් දාලා තියෙනවා. බලන්න අපි මෙච්චර මුදලකුත් ගෙවලා තියෙනවා. ඊට අදාළ නෛතික පොලියත් එක්ක අපට ගෙවීම් කරන්න කියලා. අපි මේක ආපහු දෙන්නම් කියලා පටන්ගත්තට අවුරුද්දෙන් ඒක දෙන්න බැරි වෙලා. අර මිනිස්සුන්ගෙ සල්ලි අවුරුදු දෙක තුනක් තිස්සේ හිර වෙලා තියෙනවා.

ඒක නිසා අපට ඒ ක්‍රමවේද වලට යන්න පුළුවන් මිනිස්සු ඕන තරම් ඉන්නවා. ඊට පස්සේ අපට පෙනුණ දෙයක් තමයි උඩුගම පැත්තෙ ඩිජිටල් බෝඩ් හදන්න පුළුවන්. තර්ඩ් පාර්ටි එකකට වෙනත් පාර්ශ්වයකට

විශාල බෝඩ් දාන්න. ඇත්තටම සභාපතිතුමා එක එක ආයතනවලට හෝල්ඩින්ස්වලට ඇඩ් එක නිරන්තරයෙන් දානවා. ඒකට ගණනක් අය කරනවා. ඒගොල්ලෝ තමයි ඒක හදලා සවි කරන්නේ. බලප්‍රදේශ කට්ටියට ඔය වගේ නවීන ක්‍රම භාවිත කළ යුතුයි. නැත්නම් ටිකක් අමාරුයි. අයවැය හදද්දි වැය යෝජනා වගේම ඔබතුමාලගෙන් ආදායම් යෝජනා ටිකකුත් දෙන්න ඕන. මම එක දවසකුත් කතා කළා. වෙනදා වගේ අපි ආදායම් හොයාගමු කියලා. හැබැයි එතනදි අපට තියෙන සම්පත් භාවිතා කරලා හරි, අපට මුදල් වියදම් කරන්න බැරිකමනේ තියෙන්නෙ. කිසිදු සභාවකට කරන්න අමාරුයි. දැන් මේ යන විදිහ නිසා. පුළුවන් තරම් ආදායම් වැඩි කරන යෝජනා හා වියදම් අඩු කරන යෝජනා ඒ පැත්ත ඔක්කොම අපට සලකන්න වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා අදහස් දක්වමින්**

ඇත්තටම සතුටුයි. සභා වරෙ අවසන් කාලෙ හරි, මේ වගේ සාකච්ඡාවකට ඔබතුමා සහභාගි වීම ගැන. මම හිතන්නේ ඔය තනතුරේ ඔබතුමා ගොඩක් කල් හිටියේ නැතුව ඇති. මම එහෙම දැනුවත් නැහැ. මීට ඉහත සභා වාර හතරකදී අපි ඔය සම්බන්ධව කතා කළා. අපි ඔය සීමාවෙන් පිට ඉන්න වෙලාවක්නෙ ඕක. අපේ නියමිත කාලය අවසන් වී ගෙන යන මොහොතේ හරි ඔබතුමාගේ පැමිණීම සම්බන්ධව මම සතුටු වෙනවා. ඔබතුමා කතා කරපු දේවල් පිළිබඳව අපි මේ සභාවේ සාකච්ඡා කරලා තියෙනවා. ඔබතුමා දන්නවා ඇති. මම පසුගිය සභා වාරයකදී අදහස් ප්‍රකාශ කිරීමේ දී කිව්වා. උඩුගම ප්‍රදේශයේ හොර වංගුව පිළිබඳව. ඉතාමත් අලංකාර ප්‍රදේශයක් තියෙන්නේ ඒ වගේ ප්‍රදේශවල බෝඩ් ඉදි කරලා, සභාවට රුපියලක්වත් ආදායම ඇවිල්ලා නැහැ. ඒව ගහලා ගලවන් යනවා. එහෙම නැත්නම් කඩාගෙන වැටෙනවා. රජයේ ඒවත් තිබුණා. සංචාරක අමාත්‍යාංශය ඔය වගේ අදහස් දැක්වූවා.

ඒ වගේම තමයි අපේ ප්‍රදේශයේ දියඇලි තියෙනවා. මලාමුර ඇල්ල කියලා යූටියුබ් බැලුවම ගාල්ලෙ ප්‍රධාන ඇල්ලක්. සංචාරකයෝ එන තැනක්. ඒ වගේම උඩුගම බංගම පාරේ කන්නැලිය කියන ඇල්ලක් තියෙනවා. ඇත්තටම තියෙන ඒවයින් නියම ප්‍රයෝජන ගන්නෙ නැහැ. ඔබතුමා කියන වරිපනම් ගැන මේ දවස්වල මිනිසුන්ගේ විශ්වාසය අඩුයි. උඩුගම කේන්ද්‍රකර ගත්තම උඩුගම ප්‍රධාන වසමේ මුල් ටික හොඳයි. වතු ආශ්‍රිත ප්‍රධාන පාරවල් ටික එච්චර හොඳ නැහැ. ප්‍රධාන පාර ටික හොඳයි. ඒත් බැලුවම ප්‍රධාන ව්‍යාපාරිකයෝ ටික දෙනෙක් තමයි ඉන්නේ. එක්කෙනෙක්ගේ කඩ පහක් දහයක් විතර තියෙනවා. ඒ වසම් ඇතුලේ දුප්පත් මැටි ගහපු ගෙවල්වල මිනිස්සු ඉන්නෙ. ඒ නිසා ප්‍රායෝගික වැඩපිළිවෙළ ගැලපෙන්න ඕන. මේ වැඩපිළිවෙළට ගිය සැරේ ප්‍රධාන සාකච්ඡාවේදී මීට 100 ක් තීරණය කළේ. ඒ නිසා ගිය සැරේ ප්‍රධාන මාර්ගය ආසන්නයේ තමයි ලයිට් හයි කරන්නෙත්. ඔය ප්‍රදේශයේ තමයි කුණු එකතු කරන්නෙත්, ඕකේ පාර ආශ්‍රිත නිසා තමයි පහසුකම් දෙන්නෙ. ඉතින් මේ ප්‍රදේශයට ගැලපෙන අලුත් දෙයක් කරන නිසා ඒ වගේ ගම්වලට ගැලපෙන වැඩපිළිවෙළක් කරනවා නම් හොඳයි. අර ආකාරයෙන් කරනවා නම්, උඩුගම බල ප්‍රදේශ විතරක් නෙවෙයි. තල්ගස්වල, මාපලගම, උඩලමත්ත, යටලමත්ත ඒ වගේ ස්ථාන කිහිපයක් හඳුනාගන්න වෙනවා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් ප්‍රකාශ කරමින්**

දරිද්‍රතාවය මත යම් ප්‍රදේශ නිදහස් කරන්න පුළුවන්. එතකොට ඒගොල්ලෝ සමෘද්ධිලාභීන් හරි අක්කර බදු දැනට ක්‍රියාත්මක වෙනවා. උදාහරණ- වතු සමාගම් තිබෙනවනම්, අක්කර බදු ගෙවනවා නම්, ඒක වගාවටම නිශ්චිත වෙලා තියෙනවා නම්, පදිංචිකාරයො ඉන්නවනම්, පනතෙන්ම තියෙනවා නිදහස් කරන්න කියලා. ඊළඟට වරිපනම් බදු පැනවීමේ දී, දියුණු ප්‍රදේශයක් බවට පත් කලහම, එතුමන්ලටත් තිබෙනවා වාසියක්. ඉඩම්වල මාකට් එක සැහෙන්න වැඩිවෙනවා. බැංකුවලින් ලෝන් එකක් ගනිද්දි ඒකට ලොකු ගානක් හම්බ වෙනවා. නමුත් අපි මේ කාලෙදි ඒකට අපට මුහුණ දෙන්න වෙනවා මන්ත්‍රීවරුනි,

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

මම කියන්නේ ප්‍රදේශ තුනම මාපලගම තල්ගස්වල උඩුගම තුනම එකට පටන් ගමු.

**සහකාර කොමසාරිස්තුමා**

මම හිතන්නේ ඔතන දැන් මීටර් 100 ක් පටන් ගමු. පොඩ්ඩක් අපට ප්ලෑන් එකක් හදාගන්න වෙනවනේ. බාධාවක් නෑ. ග්‍රාමසේවක වසමකට මේ පැත්ත එක් වසමක්. අනෙක් පැත්ත තවත් වසමක්. එතකොට ඒ වසම් දෙකම අරගෙන පොඩ්ඩක් පටන් ගමු වැඩේ.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

ප්‍රායෝගික ගැටලු රාශියක් මතු වෙනවා ආයතන කිහිපයක් එක්කනේ වැඩ කරන්න වෙලා තියෙන්නේ. දැන් 2006 ට වඩා අමාරුයි. ඉස්සර භූ විද්‍යා හා පතල් කැනීම් සම්බන්ධව නිර්දේශ ලබා ගැනීමේ කටයුතු තිබුනෙ නැහැ. ඒ නිසා අපි ගොඩක් අපහසුතාවයට පත් වුණා.

අපට තල්ගස්වල පොල හදන්න සල්ලි දුන්නා. පොළ ප්ලෑන් කළා. ඒක තිස්සමහරාම පොළටයි. අපේ පොළටයි එකම ප්ලෑන් එක. නමුත් භූමි දෙකක්. ඒ නිසා ඒ ප්ලෑන් එක අපට ගැලපෙන්නෙ නැහැ. සැළසුම් හදපු අය දන්නෙ නැහැ. ඒ හේතුවෙන් පොළ සාර්ථක වුණේ නැහැ. ඒ වගේ ප්‍රායෝගික ගැටලු තියනවා. අපි වියදම් කරන්න ඕන එයාලා කියන විදියට. මන්ත්‍රී මණ්ඩලය 13, 27 වෙලා, මන්ත්‍රී මණ්ඩලය එක් වෙලා තමයි තීරණය කරන්න ඕන මේ කොට්ඨාසෙ වැඩ කොහොමද කරන්න ඕන කියලා. නමුත් අපි කොහොම තීරණය කර ගත්තත් වැඩක් නැහැ. ඉහළ ඉන්න නිලධාරීන් කතා කරල කිව්වොත් එහෙම අහවල් ගොඩනැගිල්ල එහෙම කරන්න බෑ කියලා, එයාලා කියන විදියට හදන්න ඕන කියලා. අපි ඒ කියන විදිහටම හදන්න ඕන. අපට කිව්වා නම් ඔය එවපු සල්ලි වලින් ඇප්තොප් එක වවන්න කියලා, ඒක අධීක්ෂණය කරලා, ඒක හොඳ ආදායම් එන මාර්ගයක්. හැබැයි අද ඒ ඉඩම් ටිකත් වවා ගන්න බැහැ. කොමසාරිස්තුමා ඒ විදිහට ඉහළින් එන වැඩ පිළිවෙලවත් නිවැරදි නැහැ. අපිත් ආදායම් වැඩි කරගන්න කිසිම වැඩපිළිවෙලකට යන්නේ නැහැ. පොදු අරමුදලෙත් සල්ලි නැහැ. පරිපාලන වියදම් ටික ගියාට පස්සේ දහ වෙනිදට පඩි ගෙවා ගන්න බැරි කාලයක් මෙහෙ තිබුණා. බැසිල් රාජපක්ෂ මහත්තයාගේ කාලේ වැඩක්ම නැති වාහන ලොට් එකක් ගෙනැල්ලා දැම්මා. සභාව වැටෙන්න එක් හේතුවක් තමයි ඒක. අපි ඉල්ලපු දේවල් නෙවෙයි. අපි ඉල්ලපු නැති දේවලුත් දුන්නා. හැබැයි අපි 2006 - 2011 කාලය ගත්තොත් සභාවේ අරමුදලෙන් අදාළ කටයුතු කලේ. ඊට පස්සේ තමයි අර වාහන ආවේ. අපේ පිට දාලා අපි ණය කාරයෝ කලා. ඇත්ත වශයෙන්ම අපි j.c.b. එකක් ඉල්ලුවා. ඉල්ලපු දේ දුන්නද? ඒ වෙනුවට චයිනීස් වාහන ටිකක් දුන්නේ. අපට වගේම ඒ චයිනීස් වාහන දීපු හැම සභාවක් ම ඒ අමාරුවේ වැටිලා තියෙනවා. අද අපි ආදායම් වියදම් ප්‍රශ්නය ගත්තොත්, බරපතළ ප්‍රශ්න. ඉහළින් ගන්න මොනයම් හෝ තීරණ නිසා සභාව බරපතල ප්‍රශ්නයකට මුහුණ දීලා තියෙන්නේ. අපට j.c.b. එකක් දුන්න නම් එක පාරක් හෝ කපාගන්න තිබුනා. වාහන 5- 6ක් හම්බවුණත්, ලැබුනෙ ඉල්ලපු දේ නෙවෙයි. ප්‍රාග්ධනය යොදවන්න අපේ පොදු අරමුදලෙ කොයි වෙලාවකවත් මුදල් නැහැ. ඊළගට ආදාහනාගාරයක් හදන්න හැදුවා. ඒක කෝටි පනහකට අතරමග නතර වුණා. දැන් කෝටි දෙකහමාරක් ණය ගන්න හදන්නේ. ඒකත් අතරමග නතර කරලා දැම්මා. දැන් අපි හරිම අමාරුවකනෙ දැම්මෙ. ආදාහනාගාර ගොඩනැගිල්ල අතරමග ගරා වැටිලා, ඒකට සල්ලි දෙන්නෙ නැහැ. දැන් ඒවා කොට උඩ. දැන් මම කතා කළේ, හොඳටම කතා කළ යුතු අවස්ථා. වෙනදා කතා කරන්න අපට අවස්ථාවක් හදලා දෙන්නේ නැහැ. සභාවට ඕන දේවල් ටික දෙන්න. ගඟ අයිනෙ තියෙන සභාවලට ගංවතුරෙන් යටවන වෙලාවල්වලදී අවශ්‍ය වාහන තමයි දෙන්න ඕන. ඒ ඒ සභාවල ඉන්න මිනිස්සුන්ට තීරණය කරගන්න දෙන්න. අපට ගිහිල්ලා නිලධාරීන් සමග ඔය සබඳතා ගැන සාකච්ඡා කරන්න බැහැ. ඊළඟට දැනටත් ඔබතුමා ආවේ ආදායම් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා. දැන් ඉතින් අපි මේ තියෙන ටිකෙන් ආදායම්

ප්‍රවර්ධනය කරගෙන කටයුතු කරමු. ඔබතුමාලා නිලධාරීන් සමග සාකච්ඡා කරලා, පුළුවන් තරම් සහයෝගය දෙන්න. මේක දැන් කතා කළාට වැඩක් නැහැ. ගැසට් එකට ගන්න කාලයක් යනවා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

වරිපනම් බදු අය කිරීම සම්බන්ධව උඩුගම ප්‍රදේශයෙන් මීටර් 100 වශයෙන් අවසන් තීරණය කරලනෙ තියෙන්නෙ. ඒ මීටර් සීයයෙන් අපි පටන් ගමුඕක බාධාවක් නැහැ. පොඩි කරදරයක් තියෙන්නෙ. ග්‍රාම නිලධාරී වසම් අනුව කළෝතින් අපට මේවා කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා අදහස් දක්වමින්**

ග්‍රාම නිලධාරී වසම් පාරේ එක පැත්තක එක වසමක් අනිත් පැත්තෙ තව වසමක්

**සහකාර කොමසාරිස්තුමා**

ඒ වසම් දෙකම අරගෙන කරන්න පුලුවන් විදිහට එකතු කරල කරමු. පොඩ්වට පටන් ගමු වැඩේ කියලා මම කියන්නේ

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

ඒ වගේම අපි මේ යෝජනාව කලිනුත් ඉදිරිපත් කරලා තියෙනවා. අපි ඒ ගැන දැන් කතා නොකර මෙතැන් ඉඳන් පටන් ගමු කියලා කියන්නේ. ඒ වගේම වෙළඳ සංකීර්ණය හදන යෝජනා විධි අපි ලස්සනට ප්ලෑන් එකකුත් හදල තියෙන්නෙ. ප්‍රායෝගික ගැටළු රාශියක් මතු වෙනවා. ඉඩකඩම් අඩු සභාවක් නෙවෙයි. ලොකු සපෝට් එකක් දීලා, මෙහි ආදායම් වර්ධනය කර ගන්න පුළුවන්. දෙන ආධාර වගේම අපට මේවා ප්‍රවර්ධනය කර ගත හැකි නම්, අපට පරණ වාහන කෑලි තල්ලු කරන්නේ නැතුව, JCB එකක් වැනි දෙයක් දුන්නනම් හොඳයි. JCB එකක්වත් නැති නිසා මේ පාරවල් වල එක වැඩක්වත් කරගන්න බැරි වෙලා තියෙනවා. ඇත්තටම ඔබතුමාගේ පැමිණීම මම අගය කරනවා. මෙහෙම හරි සාකච්ඡා කරන්නේ ඒ නිසා. විලේගේ මහතා වැනි වගේ දක්ෂ සභාපතිවරුන් හිටියා. වරිපනම් බදු බවට පත්කර ගන්නත් ඒ වගේම තවත් මොනයම් හෝ ආදායම් තත්ත්වය වර්ධනය කර ගන්නත්, සහයෝගය ලබා දෙන්න කියලත් ඉල්ලනවා. දේශපාලන වශයෙන් 13 - 27 කලහම, ඔබතුමාට තේරෙනවනෙ මොන තරම් බරපතළ ප්‍රශ්නයක් ද කියලා. එකකට එකකුත් තවත් එකකුත් වැඩි වෙලා. මේවා සංශෝධනය විය යුතුයි. තවත් වටින අදහස් අපේ මන්ත්‍රීවරුන් දෙන්න. උඩුගම හදන පුරනැගුම ගොඩනැගිල්ලත් ඔබතුමා කිව්වා වගේ, ඔය තත්ත්වයෙන් තිබුනොත්, විනාශයට පත්වෙනවා. ඔබතුමාගේ සහභාගිවීමත්, අදහස් දැක්වීමත් අපි ගරු කරනවා. ආදායම් වැඩි කර ගැනීම ප්‍රවර්ධනය කරගැනීමට අපට උදව්වක් තමයි අවශ්‍ය.

**සහකාර කොමසාරිස්තුමා**

හරි ආදායම් ව්‍යාපෘතියකට තමයි දැන් අපි හැමෝගෙම අදහස් තියෙන්නේ උඩුගම පුරනැගුමෙන් හදපු ගොඩනැගිල්ල ඔය තත්වයේ දිගටම පැවතුණොත් ලොකු ගැටලුවක් වෙනවා. යම්කිසි ආදායම් වැඩපිළිවෙලකට යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මගේ නම් අදහස තියෙන්නේ ඕකත් ටෙන්ඩර් කරලා, යම්කිසි වැඩපිළිවෙලකට යන්න පුලුවන්ද කියලා බලන්න. එතකොට ගන්න පුද්ගලය නඩත්තු කරගෙන ආදායමක් ගෙවයි. අපි පසුගිය දිනකදි පුරනැගුම ගොඩනැගිල්ල බලන්න යන විටත් ගොඩනැගිල්ල ඇතුලේ පැත්තක් වර්ෂාවට තෙමෙනවා දැක්කා. දැන් රට යන වැඩේ ගැන බලමු. ඒකත් පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා යන වැඩක් තියෙන්නේ. ඒක නිසා අපි ඒ පැත්තට දැන් යොමු වෙමු. ඉඩමක් වුනත් අපේ පනත්වලින් යාමේ හැකියාව තියෙනවා.අවුරුදු තිහකට වුණත් පුළුවන් අනුමැතිය ලබා දෙන්න. දැන් සහකාර ආණ්ඩුකාරතුමාට අදාලා ධර්මපාල පාක් එක ඇතුලෙ සමහර ගොඩනැගිලි බදු දුන්නා. අවුරුදු 30 තනි ගිවිසුමක් අපි දෙනවා.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

අපි බලාපොරොත්තු වෙන ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි, හදන්න ඒවායේ පැනනඟින ගැටලුව තමයි මේ කිසිදු ඉඩමක නිරවුල් අයිතියක් අපට හරියට තාම ඔප්පුවකින් ලැබිලා නැහැ. ඒක ගම්සභා කාලයේ සිටම තියෙනවා. ගමකට ළිං තිහක් හතළිහක් තියෙනවා. නමුත් අයිතිය තියෙන්නෙ දෙකක වගේ. ඒ සියලුම දේවල් ඒ කාලේ සිටින සභික මහත්වරු කිසිදු අයිතියක් නැතුව හදලා. මොනම දෙයක් හෝ හදනකොට ඉඩමේ අයිතිය තිබිය යුතුයි. ණයක් ගන්නකොට, ආධාරයක් ගන්නකොට පෙන්වන්න, ක්‍රීඩා පිටියකටවත් පැහැදිලි අයිතියක් නැහැ. ඇප්තොප්වත්තෙ අපට අක්කර තිහක් ලබාදීලා තියෙනවා වාචිකව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපි ලේඛන මුකුත් ඇවිල්ලා නැහැ. අමරසිරි දොඩංගොඩ මැතිතුමා ප්‍රාදේශීය සභාවට අක්කර 35 දෙන්න ඒව දීලා තියෙන්නේ අතින් විතරයි. භූමිභාග මායම් පෙන්වන්න විදියක් නැහැ. ප්‍රාදේශීය ලේකම්තුමා ඒක දෙනවා කියලා තියෙනවා. ඒත් තවම නීත්‍යානුකූලව ලැබෙන ක්‍රමයක් ලැබිල නැහැ. ඊළඟට j.c.b. යන්ත්‍රයක් දිරාපත් වෙනවා. ඒක අපට ටෙන්ඩර් කරගන්න බැරි වුණා. ඔබතුමාලගේ පළාත් පාලන කොමසාරිස්තුමා ඒ කියන මුදලට ටෙන්ඩර් කරන්න හැදුවත්, වෙන්දේසි කරන්න හැදුවත්, ඔබතුමාලගේ කාර්යාලයෙන් එන මිල වැඩියි. ලක්ෂ හතර -පහක් හැදුවත් 8ක් 10ක් දාලා එවනවා. ඊට වඩා වැඩි ගානකින්. ඒක එහෙමම දිරාපත් වෙලා පොළොවට පස් වෙලා තියෙනවා. ගමේ ගොඩේ සාධාරණ මිලකට මේක වෙන්දේසි කර ගැනීමේ හැකියාව ලබලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඒක වෙන්දේසි කරන්න ඇවිල්ල තියෙන්නේ.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

ඊට අමතරව තල්ගස්වල නගරයේ ඔය තියෙන නාගරික පෙනුම ගොඩක් වැඩි වෙලා තියෙන්නේ, අපට අයත් බල ප්‍රදේශය නෙවෙයි. ඇළෙන් එහා පැත්ත නියාගම ප්‍රාදේශීය සභාවට. පරණ කඩ ටිකක් එක්ක පොල විතරයි ඊට මෙහා කිසිදු සංවර්ධනයක් කරලා නැහැ. අපේ සියලු නායකයෙක්ම අපේ ආයතන සියල්ලම, සියලු බැංකු ටික ,පාසල්, රෝහල්, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඇතුළු සියලු දේවල් අපෙන් එහා මායිම් පැත්තට ගත්තා. අපේ කිසි කෙනෙක් ගත්තෙ නැහැ. දැන් LRC එකෙන් ඉඩම් නිදහස් කරන්න කියලා හදනවා. එහෙමවත් අරගෙන තමයි අපේ රජයේ ආයතන ගොඩනැගිලි ටිකත් හදන්න වෙන්නේ. අපේ තල්ගස්වල නගරය අපට කියන්න පුළුවන් ශක්තියක් නැහැ. ඒ ටික තියෙන්නේ නියාගම, ඒක ප්‍රශ්නයක් වෙලා තියෙනවා සභාවට. තවත් හේතුවක් තමයි අපේ කාර්යාල කටයුතු වලදී හුඟක් දුර්වලතාවයක් වෙලා තියෙන්නේ, අපට පිරිමි නිලධාරීන් එවන්නේ නැහැ. තියෙන වැඩවලට අවශ්‍ය කරන පිරිමි නිලධාරීන් නැහැ. මීට සභා වාර දෙක තුනකට කලින් හොඳ ශක්තිමත් පිරිමි නිලධාරීන් ටිකක් හිටියා. 100% ක් නෙවෙයි කියන්නේ. 20% ක් , 30% ක්වත් ඇක්ටිව් නිලධාරීන් එවනවනම් මෙ වැඩ කරන්න පුළුවන්. පවරා ගැනීමේ ප්‍රශ්නයක් අපට තියෙනවා. මම කිව්වා ප්‍රධාන ප්‍රශ්න 2ට ඔබතුමා අවධානය යොමු කරන්න. j.c.b. එක එක්කෝ ඒක ඔබතුමාලා අරන් යන්න. මේකට මොනවා හරි කරන්න මේවා දැක්කම මිනිස්සු අපට කැගහනවා. මොනවද මේ කරන්නේ කියලා. සභාවට මේක විකුණගන්නවත්, හදාගන්නවත් බැරිවුනාය කියලා. තියෙන පිට්ටනිවලත් අයිතිය අපට නැහැ. ගොඩනැගිලි සැළසුම් අනුමත කරන්න ගිය ගමන්ම ඔය ප්‍රශ්නය එනවනේ.

**සහකාර කොමසාරිස්තුමා**

අපි භුක්තිවිඳින ටික තියෙනවනේ. මුලින්ම මායිම් කණු ටික ගහන්න බලන්න. අපි ගැහුවම විරෝධතාවයන් ඉදිරිපත් කරාවි.

**ගරු උප සභාපතිතුමා**

අපි දැන් රජයේ ආධාර ගන්න ගියහම අපට ඔප්පු නැහැ.

**සහකාර කොමසාරිස්තුමා**

අපි භුක්තියට හරි ප්‍රකාශන ඔප්පුවක් ලියා ගන්න ඕන.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

සභාපතිතුමා ඒකට අපි මොනවා හරි කරමු. මොකද ඒක නිසා මේ හැමදේම අතාරින්න බැහැනේ.

**සහකාර කොමසාරිස්තුමා**

ඒක අපේ ගොඩක් සභා වලට තියෙන පොදු ප්‍රශ්නයක්.

**ගරු උප සභාපතිතුමා**

මාපලගම රණවිරු ගම්මානයෙ අපට තියෙන අක්කර තුනක ඉඩම සම්බන්ධව අද උදෙත් කතා කළා. නමුත් දැන් එම භූමිය  අපට නොදන්වා ප්‍රාදේශීය ලේකම් රණවිරුවන්ට බදු දීලා. ඔබතුමා ඒක භාරගත්තට  ඔබතුමාට එක බාර ගන්න අයිතියක් නැහැ. බාරගන්න ඕන නැහැ. ඒකයි ඒගොල්ලො ගොවිපලක් හදන්න බාර ගන්න ඇත්තේ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඔය රණවිරුගම අපට මැණලා දෙන්නම් කිව්වා. අපට වෙන් වෙලා තියෙන්නේ තව මාස හතක්. අර සෙඩ් එකට මෙහායින් සුසාන භූමියක්. ඒක අපට මැනල දෙන්නම් කිව්වා ලිඛිතව. පසුගිය දින වලදී ඒ භූමියේ වගා කරන්න මන්ත්‍රිතුමා දැනුවත් කරලා, වගා කරන්න කියලා අපෙන් ඉල්ලුවා. ජනතාව ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම්ගෙන් තමයි  ඉල්ලලා තියෙන්නෙ, නමුත් අපෙන් දුන්නා. අර ලියුම ගෙනාපු ඒ මහත්තයාට කිව්වා අදාල බලප්‍රදේශයේ මන්ත්‍රීතුමා මෙතුමා මූලික කරගෙන කරන්න කියලා. වගා ව්‍යාපාර කරන්න ලේසි පහසු නැහැ. ඒකයි නැවත භාර දිලා තිබුණේ. ඔය හැම ඉඩමක් ම ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කරල මම මැනුම් කටයුතු සිදු කළා. යම් යම් තැන්වල අපේ භුක්තිය විතරයි. අයිතියක් නැහැ. ඒ වගේ හුඟක් ඒරියා තියෙනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

LRC එකෙන් ගෙවල හරි කරගන්න පුළුවන්. නමුත් රජය පැත්තෙන් තමයි කරගන්න බැරි.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඌරල ප්‍රදේශයේ සුසාන භූමියක් වෙන් කරල තියෙනවා. තව නඩු 9 ක් තියෙනවා. අපි හැමදාම ලෝයස්ලට ගෙවන්න ඕන. අපිත් ඉතින් නිලධාරීන් යවලා ගෙවනවා. ආදායමෙන් කොටසක් නඩු කියන ඒවටත් වැයවෙනවා. අපි මේ විදිහට අසමත් වුනේ. මේවා සම්බන්ධයෙන් දන්න දක්ෂ නිලධාරීන් නැති නිසා. අපි කතා කළාට මේ දේවල් වෙන්නේ නැහැ. අවුරුදු 31 කාලය තුල කතා කරන මේ දේවල් වෙන්න එපාය. LRC එකත් එක්ක කතා කරලා, මුදල් ගෙවලා මැන්නෙව්වා. යම් යම් තැන්වල අපේ භුක්තියක් ඇත. අයිතියක් නැත. ඉතින් ඔය වගේ ගොඩක් ඒරියා තියෙනවා. මේ මන්ත්‍රීතුමාලගේ ප්‍රදේශයේ සුසාන භූමියක් හරි වෙන්කරලා තියෙනවා. තව අක්කර 1 පර්චස් 20 ක  කැල්ලක් තියෙනවා. එකත් සභාවට තියෙනවා. තව නඩු 9 ක් තියෙනවා. ඒ ලෝයර්ස්ලා අපට මොනවත් කියන්නේ නැහැ. රුපියල් 6000.00 ,7000.00 ඉතින් අපි නිලධාරීන් යවලා ගෙවනවා. අපට වෙන උත්තරත් නැහැ. අතර මගදි නවත්වන්නත් බැහැ. ඉතින් ඔබතුමාලා වගේ දක්ෂ නිලධාරීන් ඉන්නවනම්,  අපි මේ විදියට කරන්න ඕන කියලා උපදෙස් ගන්න තිබුණා. අපි ගිහිල්ලා ඕන ඒව කරන්න.  අපි මැති ඇමතිවරුන්ගේ සහය දක්වනවා. නමුත් නිලධාරීන් ගියාට පස්සේ හිරවෙනවා.

**ගරු උප සභාපතිතුමා**

ඔබතුමාලා නිලධාරීන් ගෙන්නලා ට්‍රේනින් දෙනවා. ක්ලේම් දෙනවා. උපදෙස් දෙනවා. නමුත් ඉතින් කිසිම වැඩක් නැහැ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ට්‍රේනින් කරවන්නේ උගුර කටහඬ පුරුදු කරවන්න. උපාධිධාරීන් ගොඩක් ඇවිල්ල තියෙනවා. ඉස්සර උපාධිධාරීන් වගේ දැන් උපාධිධාරීන්ට යමක් හිතලා කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා අදහස් දක්වමින්**

අදාල නැති දේවල් මේ කතා වෙන්නේ. හිතේ තියෙන දුක කියන්නේ, වරිපනම් එකතු කිරීමත් එක් පියවරක්. ප්‍රශ්න තියෙන අනිත් සභා වල්වලට සාපේක්ෂව බලද්දී අනෙක් සභාවල්වල වගේ නෙවෙයි. දැන් වෙන ආදායම් මාර්ගවලට යන වැඩපිළිවෙළක් සම්බන්ධයෙන් ඔබතුමාගෙන් දැනගන්න කැමතියි. අපිට අපේ සභාවේ ආදායම් තත්වය ගොඩනගා ගන්න කොයි කොයි මාර්ග ද තියෙන්නෙ කියලා.

**සහකාර කොමසාරිස් තුමා**

එකක් තමයි ආදායම් නගරයක් (වරිපනම් බදු එකතු කිරීම) බිල්ඩ් බෝඩ් හදලා ගහලා ඒවයින් අයකිරීම් කරන්න. මම මේක කියාගෙන යන්නේ සුරංගනා කතාවක් වගේ වුනාට ඉඩම් වල ප්‍රශ්න ඒවා ලිහාගෙන ඒකට මුහුණ දීලා අපි යමු.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

අපේ වාහන බදු දෙන්න පුලුවන්ද?

**සහකාර කොමසාරිස්තුමා**

පුළුවන්.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

කොමසාරිස්තුමා සම්බන්ධවෙලා වතුර බවුසරයක් මාරු කරන්න යනකොට. ගලි බවුසරය වෙනුවට අපට දුන්නේ ට්‍රැක්ටර් බවුසරයක්. ඒක මාරුවකට ගැලපෙන්නේ නැහැ. පස්ගොඩ ප්‍රාදේශීය සභාවෙන් මාරුකලේ. ගලි බවුසරයක අවශ්‍යතාවය තමයි තියෙන්නෙ. අපේ මාරුවට සරිලන්නෙ නැහැ.

**සහකාර කොමසාරිස්තුමා**

ඊළඟ කාරණය තමයි සභාපතිතුමා, ඉඩමක් බදු දෙද්දී වුනත් අපට අයිතිය නැති සම්බන්ධ ගැටලු එන්න පුළුවන්. මූලිකවම මායිම් ටික හදාගෙන, ප්‍රකාශන ඔප්පුවකුත් හදාගෙන, ඒවා නම් අපට එකින් එක තමයි කරගෙන යන්න වෙන්නේ. ඊළගට මගේ මෙහෙම යෝජනාවක් තියෙනවා. මම දන්නෙ නැහැ ඔබතුමාලා මේවා ගැන මොන ආකල්පයක් දරාවිද කියලා. බල්බ් පිච්චුනාට දාන්න යන්නත් එපා. ඔබතුමාලට තව ඉස්සරහට වියදම් පාලනය කරගන්නත් වේවි. ඉතින් පුලුවන්නම් මූලික ලාම්පු ටික සවිකරලා දෙන්නම්. ආසන්නයේ ගෙවල් කිහිපයකින්වත් එකතු වෙලා, බල්බ් එකක් දාගන්න කියන්න. අපි වීදි පහන මුලින් දාලා දෙන්නම් කියන්න. බලන්න සභාපතිතුමා උදේට කොච්චර වීදි පහන් පාරවල්වල දාලා තියෙනවද? ඔබතුමාලත් කියනවා. නමුත් දවස් ගානක් මෙහෙම තියෙනවා. බල්බ් දාලා දෙන්නේ නැහැ නේද කියලා මිනිස්සු අහනවා. ඔබතුමාලා කොහොම මේ ගැන සිතාවිද කියලා මම දන්නෙ නැහැ. අපට ප්‍රායෝගික දේවල් වලට යන්න වෙනවා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

අපි ජනතාවට එහෙම කිව්වම වෙනත් ආකල්පවලින් එයාලා කතා කරන්නේ. අපට බල්බ් එකක්වත් දාලා දුන්නෙ නැහැ කියාවි.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

දැන් මේ නැතිකමින් හරි ප්‍රයෝජන ගනිමු. එයාලට කියන්න රටෙත් දැන් මේ වගේ ප්‍රශ්නයක් තියෙනවා කියලා.

**ගරු මන්ත්‍රී පතිනායක මහතා අදහස් දක්වමින්**

අපිට ඉස්සර සමාගම් වලින් බදු අය කරලා තියෙනවා. දැනට ඩයලොග් සමාගමෙනුත් බදු අය කරනවද?

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

අපි ඒ ගැන සභාවේ සාකච්ඡා වුණා. නම තියෙන කොටස ඇරලා ඉතිරි කොටසට වර්ග අඩි ප්‍රමාණයට අයකර ගමු කියලා.

**ගරු මන්ත්‍රී පතිනායක මහතා**

ඩයලොග් එකෙන් විතරයිනෙ අය කරන්නේ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඒවා නිලධාරීන්ගේ තියෙන අඩුපාඩු. ඒවා නිලධාරී දැනගන්න ඕන අය කරගන්න. එම නිලධාරියා ඉන්නේ ඒකට. ඔහු දැනගන්න ඕන ගිහිල්ලා ඩයලොග් එකෙන් විතරක් නෙමෙයි අනෙක් බෝඩ් ගහපු තැන්වලින් අය කරගන්න. ඒක තමයි තියෙන ප්‍රශ්නය මන්ත්‍රීතුමා,

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

පසුගිය දිනකදී නිලධාරීන් එක්ක සාකච්ඡා කරද්දී, ඒ සම්බන්ධව දැනුවත් කළා.

**ගරු මන්ත්‍රී පතිනායක මහතා**

මේ ප්‍රදේශයේ තියෙනවා විශාල බෝඩ් සංඛ්‍යාවක්. ගන්න තියෙන තැන්වලින් මොනවත් ආදායමක් ගන්නෙ නැහැ. ඒ වගේම තමයි අපට අයිතිය තහවුරු නැති තැන්වල දේවල් කරලා, මුදල් යොදවලා තියෙනවා. ආදායමක් ගන්න තියෙන තැන් මේ. සභාවෙන් තමයි නඩත්තු කරන්නෙ. මේ ප්‍රදේශයේ පොදු නාන ළිං අටක් විතර තියෙනවා. නමුත් මොනම දෙයක්වත් සභාවේ අයිතිය නැහැ. තාමත් සභාවෙන් හදන්නේ. අපේ ප්‍රදේශයෙත් ඒ වගේ ප්‍රශ්නයක් තියෙනවා. කොමසාරිස්තුමා, පොදු නාන ලිඳක්. ඒක පෞද්ගලික ප්‍රශ්නයකදී කඩලා දාලා තියෙන්නේ. නමුත් නීතිමය ආකාරයට කටයුතු කරද්දී අපේ සභාවට අයිතිය නැහැ.

**සහකාර කොමසාරිස්තුමා**

ව්‍යාපාර බදු අක්කර බදු ගන්න බැහැ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

අක්කර බදු නැහැ. ගොවිජන එකට ගෙවන්නෙ. ඉස්සර ඔය කියන ස්ථාන, ගම්සභා කාලේ ගම්වල මිනිස්සු පරිත්‍යාග කරපුවා. ඔප්පු තප්පුවලින් නෙවෙයි. ඒ ලිපිද්‍රව්‍ය ගම්සභා කාලේ ඉඳන් අස්ථානගත වෙලා තියෙන්නේ. අපි මෙහෙ බදු එකතු කිරීමේ ක්‍රියාවලි හදනවා. නමුත් එය එකතු කිරීමේදී අපි අසමත්.

**සහකාර කොමසාරිස්තුමා**

දැන් මේ පළාත් පාලන ආයතනවලට තියෙන විශේෂත්වය තමයි. මට ලියුම් කැල්ලකින් මේ සභාවට ඉඩම් කැල්ලක් දෙන්න පුළුවන්. ඒක අර සාමාන්‍ය නීතිය නම්, දැන් අපි ඉඩම් පවරනවා නම්, ඔප්පු ලියන්න ඕනනේ. ඒක මේ පළාත් පාලන ආයතනයට අදාල නැහැ. ඒක මේ පනතේ ම තියෙනවා. 1840 වංචා වැළැක්වීමේ පනතේ විධිවිධානවලට අනුව තමයි ඔය ඔප්පුව ලියන්න ඕන. සාධන පත්‍රය, රෙජිස්ටර් කරන කටයුතු සාමාන්‍යයෙන් කියන්නේ ඔප්පු තිරප්පු ටික, ඒක ලේකම් භාරයේ සේප්පුවේ තියාගන්න ඕන. අඩුගානේ මට දැනගන්න ලැබිච්ච විදිහට, අපේ සභාවෙ මුල් කාලේ පත්වීමුත් නැහැ. ගැසටුත් නැහැ. පළමු සභාපතිතුමයි, දෙවැනි සභාපතිතුමයි අඩුම ගානේ පළවෙනි සභාපතිතුමාගේ ඉඳලා දැන් ඉන්න සභාපතිතුමාගේ පොටෝ ටිකක්වත් ගහලා, සභාවේ පෙළගැස්ම හදලා තියෙනවා නම් හොඳයි.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

අපි සියලු දෙනාම විවිධ අවස්ථාවලදී ඔය කියන කාරනා සම්බන්ධයෙන් කතා වෙලා තියෙනවා. අපි කොහෙන් හරි පටන් ගමු. වරිපණම් එකතු කර ගැනීම සඳහා ඔබතුමාගෙන් දෙන්න ඕන සහයෝගය උපරිම මට්ටමෙන් අපට දෙන්න.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

ගම් ඇතුලට වෙන්න, දරිද්‍රතාවය මත අයබදු අය කරන්න බැහැ. ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළ ලයින් කාමර අයින් කරන්න පුළුවන්. ගම්වල අඩු ආදායම්ලාභීන් ඉන්නවා. ඒ අය අයින් කරන්න ඕන.

**සහකාර කොමසාරිස්තුමා**

දරිද්‍රතාවය මත ග්‍රාම නිලධාරි මහත්මයගෙන් තොරතුරු අරගෙන ඒ කටයුතු කරන්න ඕන.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

ගම්වල ඉන්න දරිද්‍රතාවයෙන් යුත් පවුල් බැහැර කරන්න ඕන. නමුත් ඒ මිනිස්සුත්, ගම් දියුණු වෙලා යම් තත්වයකට ආවහම, අපි බලන්න ඕන ඒ අයගෙනුත් අය කරන විදිහ. ඒවගේම ඒ කාර්යයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් සම්බන්ධ කරගන්න වෙනවා.

**සහකාර කොමසාරිස්තුමා**

ඔව්, අඩු ආදායම් ලාභියා කියලා තහවුරු කරගන්න.

**ගරු උප සභාපතිතුමා**

පාර මීටර් සීයක් විතර ගමු.

**ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා**

වරිපනම් ගෙවන්න පුළුවන් පවුල් ටික වෙනම හඳුනා ගන්නවා. බැරි පවුල් ටික වෙනම හඳුනා ගන්නවා.

**සහකාර කොමසාරිස්තුමා**

ඒක ගැටළුවක් නැහැ. ක්‍රමවේදය හොඳයි.

ලේකම්තුමිය, මේක ලබන සභාවාරයටම දාලා ක්‍රියාත්මක කරන්න. කල් යවන්නේ නැතිව.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

අපි මෙහෙ තීරෝද රථ සංගම් වලින් මුදල් අය කිරීමක් නැහැ.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

ඒක මෙහෙමයි උප සභාපතිතුමා සංගමයක් ලියාපදිංචි කරලා තියෙනවද? අපි එයාට දෙන දේ. උදාහරණ ලෙස අපි පාකින් ප්ලේස් එකක් දෙන්න එපැයි. එහෙමනම් පාකින් ප්ලේස් එක අපේ ද? හැබැයි අපට ඕකට විකල්පයක් දෙන්න පුළුවන්. අපි RD එකෙන් අවසරයක් ගන්නවා. මෙතන පාකින් ප්ලේස් එකක් දෙනවා. ඒ පාර්කින් එකට අවශ්‍ය මොනවා හරි ටිකක් අපි දෙන්න එපාය.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

නාගොඩ ප්‍රදේශයේ කැටගල් අල්ලලා තියෙනවා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

ඒක පාදක කොටගෙන අපට ගාස්තුවක් අය කරගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**

ස්ථාන නැති එක.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

පාර අයිති කාටද? අපි එතනින් අවසරයක් ගන්න ඕන.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

ඒ ත්‍රීවිල් රථ සංගම් වලින්ම තමයි ඒ යෝජනා එන්නේ. අපිත් එක්ක එයාලා බැඳෙන්න කැමතියි. එයාලගේ ගැටලු විසඳාගන්න අපට දෙන්න දෙයක් නැහැ. ඒකයි අපට එයත් එක්ක බැඳෙන්න බැරි ස්ථානය නොමැතිකම RD එකෙන් අපි සමග බැඳෙන්නෙත් නැහැ.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

අපට බැඳෙන්න කැමති නැත්නම්, අපට අනුන්ගේ තැනකට බලෙන් ඉදිරිපත් වෙන්න බැහැනේ, උප සභාපතිතුමා

**ගරු සභාපතිතුමා**

පොලිසියෙ ප්‍රශ්නයක් නැහැ. RDA එකෙන් නිත්‍යානුකූලව දෙන්නෙ නැහැ.

**සහකාර කොමසාරිස්තුමා**

පොලිසිය කියන්නේ නීතිය හා සාමය කඩවන තැන් බලන තැනක්. ඒ නිසා පාරේ අයිතිය තියෙන්නෙ RDA එකට. ඒ නිසා RDA එකෙන් අවසර ගත්තම ඇති.

පොලිසියට කියන්න බැහැනේ. පාර අවහිර වෙන තැන් තමයි ඒගොල්ලො බලන්න ඕන. ඔබතුමාටත් පාරවල් සම්බන්ධව බලයක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**

අපි RDA එකෙන් අවසර ඉල්ලුවා. නමුත් අවසර ලැබුණේ නැහැ. RDA එකෙන් දෙන්න බැහැ කියනවා.

**ගරු උප සභාපතිතුමා**

ඊළඟට තවත් කාරණාවක් තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා අපි අතර තියෙන සම්බන්ධතාවය නැත්තටම නැති තරම්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සමෘද්ධි සහනාධාරය බෙදනවා. ඒ හරහා අපෙන් කිසිම අවසරයක් නැතිව, ඒ තියෙන පෙට්ටි කඩවලින් 60% ක්ම තියෙන්නෙ ප්‍රාදේශීය සභාව

හරහා. විවිධ සංවිධාන වලින් දීපු පෙට්ටි කඩ. ප්‍රධාන ප්‍රශ්නයක් තමයි මාළු ලෑලි හැමතැනම දාලා බයිසිකලයෙන් ඇවිල්ලා, වාහනවලින් ඇවිල්ලා, ලෑලි දාගෙන බිස්නස් කරනවා. එළවළු, කරවල ව්‍යාපාරිකයෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් සම්බන්ධයි. නමුත් අපට ඒවායින් ආදායමක් එන්නෙ නැහැ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

උප සභාපතිතුමා කියන කතන්දරය, අපි පෙට්ටි කඩ වලින් මුදල් අය කරන්න ගියා. යම් කිසි දෙයක් කරන්න ගියහම අයිතිය ප්‍රකාශ කරන්න එනවා. ඇත්තටම කොමසාරිස්තුමා මම එදා ඉදලම උත්සාහ ගත්තේ ඔය දේවල් වලට තමයි.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

නමුත් බදු ගෙවනවා. බෝර්ඩ් එකට ගෙවනවා. අපෙන් සල්ලි අරන් යනවා. දැන් බදු අය කරගන්නේ නැතුව අපේ පොඩි කඩ ගොඩක් තියෙනවා. මේකට ගොඩක් ව්‍යාපාරිකයෝ අල්ලන් ඉන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්බන්ධයි. අපි දැකලා තියෙනවා සමෘද්ධි පෙට්ටි කඩ තියෙනවා හැම ගමකම. අපට කිසිම ආදායමක් නැහැ. මේක හරි ගැටලුවක්.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

බුලත්විට කඩයක් රෙජිස්ටර් කරලා තියෙනවා. රුපියල් 150,200 ක් ගන්නවා.

**සහකාර කොමසාරිස්තුමා**

ඒකට සංචාරක වෙළදාම සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවක් තියෙනවා. ඒ අනුව අපට පුළුවන් ඒකට බලපත්‍රයක් දෙන්න. දැන් මෙහෙමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම තියෙනවා, ඕනම කෙනෙකුට ඕනම තැනක යන්න බලය දීල තියෙනවා, පාරට අවහිර වෙන්නෙත් නැතුව එය ස්ථිර විදිහටම තියන එකක් නෙවෙයිනේ. ඒ නිසා සංචාරක වෙළදාම පවත්වාගෙන යන්න. මම දන්නෙ නැහැ, ඔබතුමාලා ඒ අතුරු ව්‍යවස්තා ටික වැළඳගෙන ද කියලා. 2013 විතර මේ හැම පළාත් පාලන ආයතනයකටම අතුරු ව්‍යවස්තා වැළඳගන්න කියලා තියෙනවා, සංචාරක ව්‍යාපාර තවත් සංවර්ධනය කරන්න කියලා හදපු එකක්.

**ගරු සභාපතිතුමා**

මම අපේ නිලධාරීන් දෙන්නෙක් මේ වෙනුවෙන් යොමු කරනවා අපේ නිලධාරි දෙන්නෙක් ඒ සම්බන්ධව දැනුවත් කරලා යොදවන්න.

**ගරු උප සභාපතිතුමා**

වැලි වලට නැහැ. ගල්කොරිවලට විකුණුම් බලපත්‍රයක් දෙනවා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

විකුණුම් බලපත්‍රයක් අපට නැහැ. උප සභාපතිතුමා අපි වෙළඳ බලපත්‍රයයි, කර්මාන්ත බලපත්‍රයයි තියෙන්නෙ. ගල්කොරි වලට දාන්න පුලුවන් උපරිම රුපියල් තුන්දාහ දාලා ඇත්තේ. එතැන තියෙනවා මෙහෙම එකක්, ගල්කොරි එකට එන වාහනවලින් අපේ පාර ඩැමේජ් වෙනවා. ඒ අයට එවිට අපි සමඟ බැඳීමක් ඇති කරගන්න පුලුවන්. මේ පාර අපට සංවර්ධනය කරන්න ඕන. ඒ නිසා ඔබතුමා සමඟ බැඳීමක් ඇති කරගන්න පුළුවන්. ඒක පොඩ්ඩක් බලල අපි ඇස්තමේන්තු කර ගන්න පුළුවන්.

අපේ තාක්ෂණ නිලධාරී මහත්තයෙක් සම්බන්ධ කරගෙන ඔය වැඩේ කරන්න පුළුවන්. ගාස්තු නම්, පොඩි ගාස්තු තියෙන්නෙ. විධායක පාර්ලිමේන්තුව විසින් එයාලට අදාල සංශෝධන ටික කරනවා. නමුත් අපට අදාල සංශෝධන ටික කරලා දෙන්නෙ නැහැ.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

දැන් ව්‍යාපාරිකයෝ ලිපි ගෙනත් දෙනවා. වැඩිපුර බදු අය කරන්න එපා කියලා. කොරෝනා කාලේ අවුරුද්දක් පුරා කඩ වහලා කියලා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

ප්‍රේමදාස මහත්තයා, ජේ ආර් මහත්මයා මේ දෙන්නගේ කාලේ අණ පනත් හදලා තියෙන්නේ.

**සහකාර කොමසාරිස්තුමා**

මේ අණ පනත් වෙනස් කළත් ප්‍රශ්නයක් .පළාත් පාලනයට අදාල ඔක්කොම නීති රීති ටික හදල තියෙන්නෙ මේ පනතින්.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

දැන් වරිපනම් බදු අය කරනකොට කොමසාරිස්තුමා, උඩුගම ගත්තත් මාපලගම ගත්තත් තල්ගස්වල ගත්තත් පොඩි ප්‍රශ්නයක් තියෙනවා. තල්ගස්වලත්, මාපලගමත්, උඩුගමත් පොදු වැසිකිලියක් නැහැ. මේවා සමහර විට මිනිස්සු ප්‍රශ්න කරන්න පුළුවන්. මේවා මම කියන්නේ හොඳ වැඩක් තමයි. වරිපනම් බදු එකතු වෙන්න ඕන. ඒක හොද වැඩක්. අනෙක් පැත්තෙන් බැලුවම මිනිසුන්ට ලබා දෙන පහසුකම්වල අඩුපාඩු තියෙනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

අවශ්‍ය කාරනා දහයක් ගත්තොත්, අටක් සම්පූර්ණයි නම්, 2 ක් විතරක් අසම්පූර්ණ නම්, අටෙන් පටන්ගෙන ඒ අඩුව පසුව සම්පූර්ණ කර ගමු. නැත්නම් අපට කවදාවත් කරන්න වෙන්නෑ.

**ගරු සභාපතිතුමා**

අපි වරිපනම් කියලා කිව්වම හැම දෙයක්ම කියලා හිතනවා. අපි දැනුවත්ව වුට්ටක් හරි තියෙන්නේ ජල නල පද්ධතිය යන නිසා, ජලය, විදුලිය, මාර්ග, රජයේ ආයතන, පාසල්, ප්‍රවාහන කටයුතු, පන්සල්, පල්ලි කෝවිල් පාර පවා තියෙනවා. බාර් තුනක් විතර තියෙනවා. මන්ත්‍රීවරු හිතයි බදු ගහලා ජනතාව විනාශ කරන්න හදනවා කියලා. නමුත් වරිපනම් එකතු කිරීම සම්බන්ධව අපේ සභාවට තියෙන ප්‍රධාන බල ප්‍රදේශය වශයෙන් උඩුගම හඳුන්වා දෙන්න පුළුවන්.

**සහකාර කොමසාරිස්තුමා**

පොදු වැසිකිළි ගැන ඔබතුමාලා අහනවා. ඔබතුමාලා උඩුගම පොලේ හදලා තිබුණ වැසිකිලි සම්බන්ධයෙන් සෑහීමකට පත්වෙනවද? ඒ වගේම සුපිරියට හදලා තිබුනා, කොහොමහරි දැනට අවුරුදු පහළොවකට පෙර ඒ කාලේ ග්‍රාමීය ආර්ථික ව්‍යාපෘතියෙන් තමයි ඒ පොල හැදුවේ. නෙළුවේ වැසිකිලි දෙකක් විතර හොඳට හදලා තිබුණා. පොල තිබුණේ සති දෙකයි වැසිකිළි ඉවරයි. අර කොමඩ් කඩලා, මම කියන්නේ ඒ වගේ පොළවල්වලට ඒ වගේ වැසිකිලි ගැලපෙන්නෙ නැහැ. අපරාද සල්ලි, දැන් අර උඩුගම තිබෙන වැසිකිලි, මමනම් ඒ වැසිකිලි පද්ධතියට කැමති නැහැ. ඒ වගේ තතැනකට සුදුසු ඒ වගේ වැසිකිලි පද්ධතියක් නෙවෙයි.

**ගරු සභාපතිතුමා**

ගම්වලට ගැලපෙන විදිහට නෙවෙයි, කොළඹින් ඇස්තමේන්තු කරලා එවන්නේ.

**සහකාර කොමසාරිස්තුමා**

වැලිවිටිය දිවිතුර සභාවට දීලා තිබුන ලොකු වාහනයක්. මේ වහනය දුවන්න එහේ පාරක් නෑ. ඒ දවස්වල එහෙට වටින්නේ බෝට්ටුවක් දෙන එක. බෝට්ටුවක් දෙන එක අපට කරන්න බැහැ. ඉතින් ඔබතුමාලගේ පැත්තෙන් කරන්න ඕන වැඩ ටිකක් තියෙන්නේ.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

සීමා නිර්ණය සම්බන්ධයෙන් ඔබතුමාගේ යම් අදහසක් තියෙනවද

**සහකාර කොමසාරිස්තුමා**

ඇත්තටම දැන් කරන්න හදන්නේ කොට්ඨාශය පොඩ්ඩක් වැඩි කරන්න හදන්නේ කාන්තා නියෝජනය සියට 25යි සභිකයන් හෝ පොඩ්ඩක් දුක් මනස ඕක කරන්න බැරි වෙයි

වැලිගම ප්‍රාදේශීය සභාව තමයි, අපේ වැඩිම මන්ත්‍රීවරු 40 ක් පමණ ඉන්නේ. එහෙම තියෙද්දි වැලිගම ප්‍රාදේශිය සභාවයි, වැලිගම නගර සභාවයි දෙක එකතු කරන්න යනවා. මීළඟට තංගල්ල නගර සභාවයි, තංගල්ල ප්‍රාදේශීය සභාවයි එකට එකතු කරන්න යනවා. දැන් එතන තියෙන්නේ මහ නගර සභාවක සහ නගර සභාවක ඔටෝමැටිකලිම දියුණු ගම් ප්‍රදේශ, වරිපනම් බල ප්‍රදේශ බවට පත් වෙන්න ඕන. නගර සභා මහ නගර සභාවෙන් නම්, අපි කරනවා වගේ ඒව කරන්න ඕන වෙන්නේ නැහැ. වැලිගම නගර සභාව, වැලිගම ප්‍රාදේශිය සභාව බැලුවම, වැලිගම ප්‍රාදේශීය සභාවෙ තියෙනවා දුෂ්කර ප්‍රදේශයක්. ඉතින් ඒකත් වරිපනම් ප්‍රදේශ බවට නිරන්තරයෙන් පත්වෙනවා. එවිට එහෙම කියද්දි තමයි අපි මේ පොඩි පොඩි කාරණා ටිකක් අරගෙන දඟලන්නේ.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

වරිපනම් සම්බන්ධව මිනිස්සු හිතන් ඉන්නේ ඒ අයට අසාධාරණයක් කියලා. නමුත් ඒ ප්‍රදේශවල මිනිස්සුන්ට අත්වන වාසිය නම්, ඉඩමෙ මාකට් එක වැඩිවීම, දියුණු ගම් ප්‍රදේශයක ජීවත් වෙන්න ලැබීම වැඩි ලෝන් එකට යන්න පුළුවන්, ඒ වගේ වාසිත් තියෙනවා.

**සහකාර කොමසාරිස්තුමා**

ඇත්තටම අපි වරිපනම් එකතු කරනවා නම්, ඒ ප්‍රදේශයට යමක් කරලා, ඒ අයට ඒක දැනෙන්න ඕන. එක රටක තිබුණා, බදු අඩු කරනවා, එවිට ඔබතුමන්ලා දන්නවා එතුමන්ලට ලැබෙන සේවා නැතිවෙනවා කියලා.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

දැන් වටවල වැව්ලි සමාගම වගේ සමාගම්, අපේ පාරවල් ටික එයාලගේ වාහන යාම සඳහා පාවිච්චි කරනවා. නමුත් නඩත්තු සඳහා කිසිම සහයෝගයක් දක්වන්නෙ නැහැ. එයාලට ඕන විදිහට පාරවල් පාවිච්චි කරනවා.

**සහකාර කොමසාරිස්තුමා**

පාරවල් ටික සංවර්ධනය කරගන්න ප්‍රාදේශීය සභා පනතට පස්සෙ කාලෙක ආවා සංශෝධනයක්, මෑතක සිට වතු පාරවල් සම්බන්ධව අපට ලොකු බලයක් තියෙනවා. ඔය පාරවල් නඩත්තු කරන්න එම සමාගම සම්බන්ධ කරගෙන වැඩක් කරන්න පුළුවන් නම් ලොකු දෙයක්.

**ගරු මන්ත්‍රී විලේගේ මහතා අදහස් දක්වමින්**

කර්මාන්ත වලින් අපට ආදායමක් එන්නේ නැහැ. ඔයිල්ෆාම් කර්මාන්තයකින් එක දවසකට තෙල් බවුසරයක් යනවා කියන්නේ, ඔයිල්ෆාම් වලින් කෝටි ගානක් එම කර්මාන්තයට ලැබෙනවා. නමුත් රජයට ඒවායින් කිසිම ආදායමක් ලැබෙන්නේ නැහැ.

**සහකාර කොමසාරිස්තුමා**

දැන් මෙතුමා කියපු ඊළඟ කාරණාව තමයි නිලධාරින්ගේ තියෙන ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

කර්මාන්ත බද්ද නැහැ. වෙළඳ බලපත්‍ර විතරයි අපට තියෙන්නෙ. පසුගිය දිනවලදී ගල්, වැලි කැණීම් වලට රුපියල් දහ දාහක වගේ බද්දක් තිබුණා. ඒකත් දැන් ප්‍රාදේශීය ලේකම් එකට ගිහිල්ලා, (භූවිද්‍යා හා පතල් කැණීම්)

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඒ වගේම අදත් පැනනැගුණු ප්‍රශ්නයක්. පාරවල් සම්බන්ධ සමහර තැන් කැඩිලා තියෙනවා. ඒ අනුව අපට බර ප්‍රමාණය නියාමනයක් කරන්න පුලුවන්ද?

**සහකාර කොමසාරිස්තුමා**

ඔබතුමාලට පුළුවන් යම්කිසි නියාමනයක් කරන්න.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

අද පැන නැගුණු ප්‍රශ්නයක් ඌරල පාර, ඒක නියාමනයක් කරලා තියෙනවා. අපට ටොන් දහයක් කිව්වට පස්සෙ ,ඒ  ආසන්නයේ තියෙනවා තේ පැක්ට්‍රිය. ලොකු ලොරි වලින් තමයි පොහොර ගෙනියන්නෙ. අපි නියාමනය කරන්නේ කොහොමද?

**සහකාර කොමසාරිස්තුමා**

අපි ඔය ටොන් 10 කියලා සීමාව ගහපු ගමන්, අපේ බල ප්‍රදේශයේ ඔය කර්මාන්තය තියෙන්නත් ඕන. අන්න ඒක නිසා ඒ ගැනත් අපි හිතන්න ඕන, අපි කරන දේවල් වලින් කර්මාන්තකරුවා අධෛර්මත් වෙන්න හොඳ නැහැ. ඔවුන්ව ආරක්ෂා කර ගත යුතුයි. ඊළඟට අපේ මන්ත්‍රීවරයෙක් කතා කළා මලාමුර දිය ඇල්ල සම්බන්ධව. සංචාරක අමාත්‍ය වන්න සාලිය ඇමතිතුමා එක්කත් කතා කරල පුළුවන්නම්, ආදායම් උත්පාදන වන යම් දෙයක් කරගන්න බලන්න.

**ගරු සභාපතිතුමා**

ඇත්තටම එම දිය ඇලි සම්බන්ධව මේ සභාවේ කතා කරලා ඇති අනන්ත වාරයක්, අපට ඊට එහා යන යාන්ත්‍රණය නැහැ.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

ජල සම්පාදනයෙ අයිතිය අපට තියෙනවා. ජලය අත්‍යවශ්‍යයි. නමුත් ටැප් ලයින් කියන්නේ නාගරික පැතිවල තියෙන දෙයක්නෙ. මේ ගම්වලටත් ඇවිල්ලා තියෙන්නෙ. ඒ අනුව ජලය කොහොමහරි සම්පාදනය කරගන්න පුළුවන්නම්, ගැටලුවක් නැහැ. ජලය, විදුලිය දෙකම තිබුනෙත් සභාවට. නමුත් දැන් අපෙන් ගිලිහිලා ගිහිල්ලා.  අපි නියාමනය කරනවා කවුරුහරි ඒකට අත ගහලා ඒක ගන්නවා. අපේ පාසල් වලට පවා දැන් ජලය සම්පූර්ණ අපට අයිතිය තිබුනෙ. අපේ විදුලි උපපොළවල් තිබුණා. අපේ තමයි විදුලි කාර්මිකයෝ හිටියේ. අපි තමයි හැමදේම කළේ. දැන් අපිට වීදි පහනක් දාන්නත් මධ්‍ය රජයෙන් අවසර ගත යුතුයි. ඒ මට්ටමට අපේ වැඩේ සංචාරක ඇමතිතුමත් එක්කත් කතා කරලා බලන්න.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඊටත් වඩා හොඳ තැනක් තිබුනා. අපේ උඩුගම ගල්පැල්ම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙනුත් ඇහුවා. අපට දෙන්නම් කිව්වා. මම ඒ සම්බන්ධව ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කළා. නමුත් ඒ වැඩේ කරගත නොහැකි වුණා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

දූවිලි ඇල්ලත් ඒ වගේ. ඒක දැන් යම් ප්‍රසිද්ධියක් ලබලා තියෙනවා. නමුත් යම් ක්‍රමවේදයකට යන්නේ නැහැ. අපි මුලින්ම ටෙන්ඩර් කරලා ප්‍රාදේශීය සභාවට දුන්න ඒක.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

මලාමුරේ හොඳ තැනක් තියෙනවා. පසුගිය දිනකදී කෝටි ගානක් වියදම් කරලා, චිත්‍රපටියක් ගහල තිබුනා. කෝටි 10ක් විතර වියදම් කරලා, නමුත් අපට ලක්ෂ දහයක් විතර ගන්න තිබුණා. නමුත් බැරි වුණා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

තවම දකුණු පළාතේ සංචාරකයන්ට ඇවිදින්න පුළුවන් ස්ථාන සම්බන්ධව අත්පොතක් නැහැ.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

සංචාරක ප්‍රවර්ධනය සඳහා තල්ගස්වල වැව රවුමත් ලස්සන තැනක්.

**සහකාර කොමසාරිස්තුමා**

මම වන්න ඇමතිතුමාට කියන්නම්. ඔබතුමා මේ ප්‍රදේශවල සියලු පළාත් පාලන ආයතන වලට කතා කරලා, ගන්න තියෙන සංචාරක සොඳුරු ස්ථාන අරගෙන පොතක් හදන්න. ඒ වගේම වෙබ් සයිට් එකක් නිර්මානය කරන්න. ඔබතුමාලට පුළුවන් එවිට ඔබතුමාලගේ ප්‍රදේශයේ තිබෙන සොඳුරු තැන් වෙබ්සයිට් එක විවෘත කරලා බලාගන්න. ඒව සරල කාරණා.

**ගරු සභාපතිතුමා**

මලාමුර ඇල්ල, ඒ ආශ්‍රිත කඩයක් අපි අයින් කරලා, එතන හදන්න හැදුවට, අපට බැහැ. මොකද ඒක වන සංරක්ෂණයට අයිති ඒවා.

**ගරු උප සභාපතිතුමා**

පාරවල් පවරා ගැනීම් දිගටම සිදු වෙලා තියෙනවා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

ඇත්තටම මේ පහුගිය කාලේ සභාව සතු පාරවල් ගැසට් කිරීම් සම්බන්ධව එම කාලයේ නඩු තීන්දු ගණනාවක්ම තියෙනවා. සියලුම සභාවලටත් එච්චා. ලැබුණ ද දන්නෙ නැහැ ලේකම්තුමිය, පනතේ 23 වගන්තියෙ තියෙනවා. කොහොමද සභාවේ පාරක් ලෙස ගැසට් කරන්නේ කියලා. මුලින්ම අපි සීමා මායිම් ලකුණු කරන්න ඕන. අපි ලකුණු කරල ඒ හරියෙ ප්‍රසිද්ධත් කරන්න ඕන. කැමති අය ඉන්නවනම් විරෝධතා ගන්න ඕන. අපි සීමා මායිම් ලකුණු කරන්නෙ නැතුව නෝටිස් කරන්නෙ නැතුව, අපි අපිට ඕන විදිහට කළොතින් අපි අභියෝගයට ලක් වෙනවා. දැන් මගේ මේ ඉඩමෙන් තමයි මුලින්ම මේ පාර යන්න හදන්නේ කියලා, පාර මැනලා, කරලා සීමා මායිම් ලකුණු කරන්න ඕන. ලකුණු කරල විරෝධතා ගෙන්වන්න ඕන. ඒගොල්ලන්ට පැහැදිලි වන ලෙස සීමා මායිම් ලකුණු කරන්න ඕන. අපේ තාක්ෂණ නිලධාරි මහත්තයා ලවා වැඩේ කරගන්න පුලුවන්. අත්පත් කර ගන්නවා නම් ඒ දීර්ඝ ක්‍රමයටම යන්න වෙනව. පාර අඩි 20 නම්, ඔය ඔබතුමා කියන හැම එකකටම යන්න ඕන වෙන්නේ නැති වෙන්න පුළුවන්. කාගෙවත් විරෝධතා නැත්නම් අත්පත් කරන්න ඕන නැහැනේ. සමහරවිට තමන්ගේ ඉඩමේ කැල්ලක් යනවනම්, එයාගෙන් ලියුමක් ගන්න ඕන. මට මේ අයිති මේ ඉඩමේ මේ කොටස සභාවට දෙන්න කැමතියි කියලා. ඒක තාම වලංගුයි. අභියෝගයට ලක්වෙන්නේ නැහැ. ඔබතුමාල කියනවා වගේ, අත්පත් කර ගන්න අවශ්‍ය නැත්නම් කමක් නැහැනේ. සභාපතිතුමා මොකද ඒකටත් වැඩි වියදමක් දරන්න වෙනවානේ. ඔබතුමාලට අත්පත් කර ගැනීමේ දී එහෙම කළොත් අවුරුදු හත අටක් යන වැඩක් වේවි. එහෙම නැති පාරවල් ටික හදා ගනිමු.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා අදහස් දක්වමින්**

LRC එකෙන් හරි කොහෙන් හරි මැනුම කරලා, පාර හදලා තියෙනවනම්, ඒ මැනුම අපට ගන්න බැරිද ගම්වල පාරවල් තියෙනවා. මේවා කරගෙන යද්දි කවුරුහරි විරෝධතා දැක්වුවොත්, පාරවල් තියෙනවා. නමුත් අපේ අයිතිය නැහැ. අපි සුද්ද කරනවා. හැමදේම කරනවා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

පුළුවන් විරෝධතා කැඳවූවට ගැටළුවක් නැහැ. ඒක වඩා හොඳයිනෙ.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

ඒක අපට වාසිදායක වෙන්නේ කොන්ක්‍රීට් කරන්න ගියහම කවුරුහරි කෙනෙක් හරස් කපනවා. ප්‍රාදේශීය ලේකම් අපෙන් අහනවා. කාට අයිති පාරක්ද කියලා, බලනකොට අපට අයිති නැහැ.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

කවුරුහරි මනුස්සයෙක් පැමිණිල්ලක් කරනවා. මේ පාර අල්ලගෙන කියලා. නමුත් කොහොමද කියන්නේ අල්ලගෙන ද කියලා.

ඊළඟ කාරණාව තමයි. ඔබතුමාලා හරිනම්, ඔය පාරවල් ගැසට් කරන්න ඕන. අලුත්ම පාරක්නම් කමක් නැහැ. නමුත් පරණ පාරක් නම් ගැසට් කරන්න ඔබතුමාට හිතුමතේ බැහැ. ඒකට විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය ගන්න ඕන. ඒ කියන්නෙ පනතෙ කියලා තියෙන්නේ, සභාව සංස්ථාපනය කරලා, වසර තුනක් යනකන් හරි අමාත්‍යවරයා විසින් විශේෂයෙන් ලබාදෙන කාලයක් ඇතුළත ගැසට් කරන්න පුළුවන්. දැන් අපට කරන්න වෙන්නේ, දැන් අවුරුදු තුන පැනලා. අමාත්‍යවරයා විසින් ඉඩදෙන වැඩිදුර කාලසීමාව තමයි ගන්න වෙන්නේ. අපේ පැත්තෙ නිර්දේශයත් එක්කනෙ යන්න වෙන්නෙ. සීමා මායිම් ලකුණු කරලද, විරෝධතා කැඳවලද ගැටළු නැද්ද කියලා සොයලා බලන්න ඕන.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

උප සභාපතිතුමා යෝජනාවක් දාලා තියෙනවා. අලුත්වත්ත මඤ්ඤොක්කාහේන පාර ඒක අපි හිතමු. අඩි 10යි. ජනතාව භුක්ති විදින මාර්ගයේ පාරක්. ඒකෙ අපි හිතමු ගැසට් එකේ දාන්නෙ අඩි අටයි මෙච්චර ප්‍රමාණයයි කියලනෙ. ගැසට් කරලා ප්‍රසිද්ධ කරනවා මේ පාර, කවුරු හරි කෙනෙක් විරුද්ධ වුණොත් මොකද කරන්නෙ.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

අතරමැදි කවුරුහරි විරුද්ධ වුණොත් එයාගේ ටික පවරගන්න වෙනවා.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

පනතේ තියෙන්නෙ එයා අපට විරුද්ධව නඩුවක් දානවා. ඊළඟට ඔතන යනවා ගැසට් දෙකක් සභාපතිතුමා මෙන්න මෙහෙමයි. සභාව සතු පාර සභාවට ප්‍රකාශයට පත් කරනවා. මේ සම්බන්ධයෙන් විරෝධතා තියෙනවා නම්, දින 30 ක් ඇතුලත දෙන්න කියලා. එයා දින 30 ඇතුළත විරෝධතා දුන්න කියල හිතමු. අපි හිතමු විරෝධතා නැහැ. ඊට පස්සේ අපි ගැසට් එක ගහනවා සභාව සතු පාරක් යන ගැසට් එකේ දානවා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඒකට අපට වියදමක් දැරීමක් නැහැ. මැනීම් හා පවරා ගැනීම් කටයුතු වලට තමයි අපිට එතකොට වියදම් වෙන්නේ.

**කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

මැනුම් කටයුතු වලට යන්න එපා. මුදල් වියදම් නොවෙන පාරවල් ටික ගැසට් කරගන්න.

**ගරු සභාපතිතුමා**

මැනුමක් අවශ්‍ය නැද්ද?

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

නෑ සීමා මායිම් ටික ලකුණු කරන්න. ඔය මිනින්දෝරු මැනුම අවශ්‍ය වන්නේ අත්පත් කරගන්න විට. නමුත් ඊළඟට අත්පත් කර ගැනීම යන්නේ ප්‍රාදේශීය ලේකම් හරහා. අපි යෝජනාව සම්මත කරගෙන, මිනින්දෝරු මැනුම සකස් කරලා, මැනුම සම්මත කරගෙන ගෙවීම් කරන්න ඕන සභාව, ඔබතුමාලා ඒ යන තක්සේරුව process කරන්නේ 100%ක්, ප්‍රාදේශීය ලේකම් ගාව ඩිපොසිට් කලොත් විතරයි ඔබතුමාලට ලැබෙන්නෙ. ලියකියවිලි නැතිව අපි ප්‍රොසෙස් කරන්නෙත් නැහැ. ඕනෑම ඉඩමකට ඇතුල්වෙලා පාරවල් හදන්න පුළුවන් බලය, ඔප්පු තිරප්පු ඉල්ලන්න පුළුවන් ඒ බලය සභාපතිතුමාට පනතෙන්ම දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

මේ සභාවෙ පාරවල් එකක්වත් පවර ගෙනත් නැහැ. මේ සභාවේ තාක්ෂණ නිලධාරි මහත්වරුන්ගෙයි, අපි හැමෝගෙමයි වැරදි.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

මනුස්සයෙක් මේකට උසාවි නොයන තාක් කල් අපි දන්නෙත් නැහැ, පාරවල් අපට අයිති ද කියලා. හරි නම් අපි මේ කරන කටයුතු 99% මිනිස්සුන්ට උසාවි යන්න පුළුවන්, ඉඩම්වල පාරවල්වල කාලාවරෝධය නීතිය කියලා, මනුස්සයෙක් අවුරුදු දහයක් භුක්ති වින්දොත් කාලාවරෝධයෙන් හිමිවෙනවා. නමුත් රජයේ ඉඩමක් අවුරුදු සීයක් භුක්ති වින්දත් කාලාවරෝදයට යටත් නැහැ. කොහොම නමුත් මම දැකලා තියෙනවා. ගම්සභා කාලයේ පාරවල් ගැසට් කරනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

බස් එකක් දාන්න පුලුවන්නම්, සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් යම්කිසි ආදායමක් ලබාගන්න පුළුවන්.

**සහකාර කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

ඒක හොඳයි. වාණිජ ව්‍යාපෘති විදිහට යන්න පුළුවන්. ඒ වගේම තමයි අලුතින් හිතලා යන්න ඕන.

අපි කතා කරා වගේම අපි වැඩ ටික පටන් ගනිමු.

**විශේෂිත සභා වාරයේ ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන්ද, කොමසාරිස්තුමාගෙන්ද අවසරයි. අද දින අපේ මහා සභාවාරයේ විශේෂිත අවස්ථාවක් කරගත්තා. මේ වෙලාවේ ඇත්තටම ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, දේශපාලනයේ මන්ත්‍රීවරු හැටියට මහජන නියෝජිතයන් හැටියට තනතුරු ලබලා මේ ස්ථානයට ආවේ. අපේ සුඛ විහරණයට නෙවෙයි. සමාජ සුඛ විහරණයට. බලප්‍රදේශයේ යහපත් දෙයක් ජනතාව වෙනුවෙන් කිරීමේදී, ඒක තමයි අපේ විශේෂිත බලාපොරොත්තුව. පාඨයත් ඒකයි. මුළු ලංකාවෙම ප්‍රාදේශීය සභා ගත්තත්, ඒ සභාවල පාඨයත් සමාජ සේවාවන්. ඒ ආකාරයෙන් ජනතාව වෙත ඉටුකිරීම මෙසේ කිරීමට අපට යහපත් මූල්‍ය තත්ත්වයක් තමයි අවශ්‍යතාවය වෙන්නෙ. විශේෂයෙන්ම මෙහි පරිපාලනයට ආධාර ලැබුණත්, ප්‍රාදේශීය සභා ගත්තත්, සභාවක ආදායම තමන් උත්පාදනය කරගෙන, ගම් කාරක සභාවන් ප්‍රාදේශීය සභාවන්වල බලය, මූල්‍ය තත්වය හොඳ වුනොත් තමයි සමාජයට යම් දෙයක් ඉටුකරගන්න පුළුවන් වෙන්නේ. වෙනත් ආකාරයෙන් දේශපාලනික වශයෙන්

මැති ඇමතිතුමන්ලා මධ්‍ය රජයෙන් දෙන ආධාර, පළාත් සභා වලින් දෙන ආධාර වලින් තමයි අනෙක් සංවර්ධන කටයුතු කරන්නේ. සමාජ සුබසාධනයන් කිරීම සඳහා අපිම උත්පාදනය කරගත යුතුයි. නමුත් අපේ හිටපු අජිත් එඩේරආරච්චි මහත්තයා කිව්ව වගේ, අවුරුදු තිස් එකක් ප්‍රාදේශීය සභා ගෙන යනවා. එදා තිබුණු ප්‍රාදේශීය සභාවමයි. ප්‍රාදේශීය සභා සභාපතිවරුන් පස් හය දෙනෙක් හිටියා. හැම සභාපතිවරයෙක් ම උත්සාහ ගන්නෙ සභාවේ දියුණුව පතා, අපේ සමාජයේ පැවැත්මටත් මොනයම් හෝ දෙයක් කරලා, දියුණු තත්වයක් ඇති කරන්න. අපේ සභාවේ මන්ත්‍රීවරුන් එන්නෙත් ඒකයි. අපි ඒ පරිපාලනය කොටස් බෙදලා, විමධ්‍යගත කරලා, තවත් හොඳට කරන්න ගියහම ප්‍රශ්න වැඩියි. වෙනදා 13 දෙනාට තියෙන ප්‍රශ්න දැන් 27 දෙනකුට තියෙනවා. මේ විසි හත් දෙනාගේ ප්‍රශ්න මේ මධ්‍යස්ථානයට එනවා. ප්‍රශ්න වැඩියි. ඔබතුමා කිව්ව වගේ වියදම් වැඩියි. ආදායමක් නැහැ. ආදායම් අඩුයි. එතැනදි අපි යම් යම් ක්‍රියාමාර්ග ඔස්සේ වැඩ කටයුතු කරන කොට, යම් යම් අපහසුතා ඇති වෙනවා. මටත් බැනුම් අහන්න වෙනවා. මම මෙම කොමසාරිස්තුමාගෙන් අහනවා. ගම්සභා කාලයේදී හිටියෙ නිලධාරීන් පහයි, හයයි. ඉස්සර නිලධාරීන් අඩුයි, දැන් නිලධාරීන් වැඩියි. සභාවට අවශ්‍ය කම්කරුවො අඩුයි. ඉස්සර කම්කරුවො තිහක් විතර හිටියා. අද නිලධාරීන් 30 40 ඉන්නවා. කම්කරුවො ඉන්නෙ 5 දෙනයි. සභාවෙන් අවශ්‍ය දේ ඉටු කරන්න කට්ටිය මදි. ඔෆිස් එකේ තමයි ඉන්නේ. ඒ වෙනස වෙනස් විය යුතුයි. සභාවට ඕනෙ කම්කරුවන්. සභාවෙන් වෙන්නේ කම්කරු කාර්යයන්නේ. ඒක අපි නොහිතන පැත්තක්. දැන් රැකියා උත්පාදනය කරන ස්ථානයක් වෙලා, දේශපාලනික වශයෙන් අපි අපහසුතාවට පත්වෙනවා. මොකද නිතරම අහන්නේ පාරවල් ටික සුද්ද කරගන්න. ග්‍රාම නිලධාරී වසම් 53ක් සුද්ද කිරීම, කුණු ඇදීම නිලධාරී යවන්නද එම කටයුතු සඳහා. බැහැ. මේ වකවානුව තුළ අසරණ තත්ත්වයට පත්වෙලා තියෙන්නෙ. මේක තමයි ඇත්ත. මුදල් ටිකක් තියෙනවා නම්, මේ සේරම දේවලින් ටිකක් මිදෙන්න පුළුවන්. බද්දෙගම ප්‍රාදේශීය සභාවේ කෝටි 6 ක මුදල් තියෙනවා. මේ වන විට එයාලට කුඹුරු කරන්න ලක්ෂ දෙසිය ගාණක් තියෙනවා. ඕක අපේ දේශපාලන නායකයොත් අහනවා කරන්නෙ නැද්ද කියලා. මම කියන්නේ ඔබතුමාලා මුදල් දෙනවා නම්, මම කරල දෙන්නම් කියලා. ඒ වගේ දේවල් අපෙන් අහනවා. නමුත් කරන්න පුළුවන් අය කරනවා. ඒ නිසා තමයි අපි බලන්නේ මුදල් උත්පාදන වැඩසටහන් කරන්න. අද කොමසාරිස්තුමා සම්බන්ධ වෙලා, මම එතුමා යම් යම් කොට්ඨාශ වලට එක්ක ගෙන ගියා. ඇප්තොප්වත්තට එක්ක ගියා. තල්ගස්වල පොල ප්‍රදේශය උපකාර්යාලවලට වාහන ගාල් කරලා තියෙන ස්ථානයට ගිහිල්ලා පෙන්නුවා. මේ වන විට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව අදහස් ගන්න. ඔබතුමා එදා අපට කිව්වා. සභාපතිතුමා මෙන්න මේ වගේ යන්න ඕනි මෙන්න මෙහෙමයි කියලා. ඒ නිසා තමයි ඔබතුමා අද මේ ස්ථානයට කැඳෙව්වේ. මම මන්ත්‍රීවරුන් සේරමත් දැනුවත් කලා. අද දින විශේෂ සභා වාරයක් ලෙස කාරක සභා වාරයක් පත් කරලා, ඒ අවස්ථාවේ ඔබතුමාලගේ යම් අදහස් විමසලා, මොකද මේ මන්ත්‍රීවරුන් විසි හත් දෙනාගෙම අදහස් විසි හතක් තියෙනවා. යම් විදිහකින් අපි එකක් කරන්න යන කොට ඒක හොඳ නැහැ මේක හොඳයි කියලා කියනවා. නමුත් එකිනෙකාගේ අදහස් වලට ගරු කරන්න ඕන. මම ඒකාධිපතිත්වයක් අර නොගෙන සියලුම මන්ත්‍රීතුමන්ලාගෙ අදහස් අරගෙන, අපි කටයුතු කරන්නේ ඒකයි. සහකාර කොමසාරිස්තුමා කිව්වා වගේ සභාපති කෙනෙකුට තිබෙන බලතල මම දන්නවා. කොහොම නමුත් සභාපති කෙනෙක්ගේ බලතල අපි ඒ ආකාරයෙන් ක්‍රියාත්මක නොකරන්නෙ කරන්න බැරිකමට නෙවෙයි. මගේ තිබෙන මානුෂීය හැඟීම නිසා. ඒත් වර්තමාන කාල වකවානුවත් එක්ක සියලු දෙනාත් එක්කම කටයුතු කරන්න ගිහිල්ලා, සමහරවිට ඒ අවස්ථාවලදී මම අසමත් වෙලා තියෙනවා. මොකද හැම දෙනාගේම ඒවට ඇහුම්කන් දෙන්න ගියහම, එතැනදී මගේ නායකත්වයේ දුර්වලකමක් තියෙන බව පෙනී යනවා. නමුත් වැඩේ තේරෙනකොට මම පසු බැහැලා, නමුත් අද ඉඳලා හරි ලබන මාර්තු 31 වන විට මම හිතන්නේ, ඡන්දයක් කොහොමවෙතත්, ප්‍රාදේශීය සභා විසිරවීමේ කටයුත්තක් වෙනවා කියලා යම් යම් අදහස් තියෙනවා. හෙට වන දේශපාලන ව්‍යාකූලත්වය පිළිබඳව අපට කියන්න බැහැ. සහකාර කොමසාරිස්තුමා, ඔබතුමා අද අපට විශාල අදහස් ප්‍රමාණයක් මෙන්ම දැනුම ලබා දුන්නා. වරිපනම් අය කර ගැනීම සම්බන්ධව, ඇත්තටම උඩුගම මන්ත්‍රීවරු හිතයි. උඩුගම මිනිස්සුන්ට අනවශ්‍ය බරක් පටවලා, ඔවුන් සමග ක්‍රෝධය ඇති කරගත්තා කියලා. නැහැ අපි 2018 වර්ෂයේ තමයි සභාවේ යෝජනා වෙලා, වරිපනම් එකතු කරන්න යෝජනා කළේ. උඩුගමඩ ප්‍රදේශය කේන්ද්‍ර කොට ගෙන මීටර් 100 ක් දුර ප්‍රමාණයක. එහිදි අපේ දැනුවත්භාවය නොමැතිවීම නිසා ඒක

යටපත් වුනා. දැනුවත් කරලා තිබුන නම්, මේ වෙද්දී වරිපනම් කටයුතු සිදු කරනු ලබනවා. මොකද එතනදි එක එක අයගේ අදහස් තිබුණේ වරිපනම් අය කරගන්න කොට, ජලය, විදුලිය මාර්ග, කසල එකතු කිරීම ඒ වගේ නොයෙක් පහසුකම් නමුත් අපට ඒ පහසුකම් නැහැ. ඔබතුමා කිව්වා එදා ජලය ප්‍රධාන අත්‍යවශ්‍ය පහසුකමක් වුණත්, ටැප් ජලය නැති වුණාට ලිං ජලය තිබුනොත් ජල පහසුකම් ප්‍රමාණවත් කියලා. ඒ නිසා බොහොම හොඳයි ඒ කටයුත්ත කරන්න. ඒ සඳහා උනන්දු දක්ෂ නිලධාරී දෙන්නෙක් සම්බන්ධ කරලා, ඔබතුමාව සම්බන්ධ කරගන්නම්. මොකද පස්සෙ වුණත්, මේ සභාවේ වැඩ කටයුතුවලට උනන්දු වෙලා, දිරිමත් කරලා, විශේෂයෙන් අපි කොමසාරිස්තුමාට ස්තූතිවන්ත වෙනවා මේ දේ වලට යොමුකරලා කැප වෙලා කටයුතු කරන එකට. නිලධාරීන්ගේ ප්‍රශ්නත්, අඩු පාඩු මොනවද කියලා නිලධාරීන්ගේ අඩුපාඩු පෙන්වලා දීලා, මෙහෙම වැඩ කටයුතු කරන්න ඕන. ආදායම් උත්පාදනය කර ගන්නේ මෙහෙමයි. එකතු කරන්න නිලධාරියෙක් කැඳවලා, මෙහෙමයි කරන්න ඕන කියලා උපදෙස් දුන්නා. සහකාර කොමසාරිස්තුමා මටත් යම් අවවාදයක් දුන්නා. සභාපතිතුමාගේ බලතල ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි කියලා. ඒ නිසා මම කොමසාරිස්තුමත් දැනුවත් කරලා, අපේ ඇත්තටම දක්ෂ නිලධාරීන් ඉන්නවා. නමුත් දැනුවත්භාවය පළාත් පාලන රීති පිළිබඳව දැනුවත්භාවය පිළිබඳ ප්‍රශ්න තියෙනවා. ඒ කාලේ උපාධිධාරීන්ට හිතන්න නිදහස තිබුනත්, දැන් වැඩිපුර වෙලා තියෙන්නෙ උපාධිධාරීන්ට අරගලනෙ.

කොහොම වෙතත් ඕක තමයි සත්‍යය. එහෙමනම් ඔබතුමාගේ අද දින වටිනා කාලය කැප කරලා, අපව දැනුවත් කරලා, අපේ මන්ත්‍රීවරු දැනුවත් කරලා, අපි සියලු දෙනාම දැනුවත් කරන්න පැමිණීම පිළිබඳ ඔබතුමාටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූතිවන්ත වෙමින්, විශේෂයෙන් ඔබතුමා අද පැමිණිලා අපේ නිලධාරීන් දැනුවත් කරලා මම හිතන්නේ නාගොඩ ප්‍රාදේශීය සභා විශේෂිත ප්‍රාදේශිය සභාව ඉදිරියේදී අප සැමට ශක්තියක් වේවායි ප්‍රාර්ථනය කරමින්, විශේෂයෙන්ම සභාව කාරක සභාවක් බවට පත් කරලා, මගේ කතාවෙන් පස්සේ කාරක සභාව අවසන් කරලා, වෙනත් කථා යටතේ සභාව අවසන් කිරීමට කටයුතු කරමු.

**ගරු කොමසාරිස්තුමා අදහස් දක්වමින්**

හොඳයි එහෙනම් ගරු සභාපතිතුමා, උප සභාපති තුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයටත්, සියළු දෙනාටත් ස්තූතියි

**2022.11.09 දින පවත්වන ලද විශේෂ කාරක සභා රැස්වීම මෙතැන් සිට මහා සභා රැස්වීම ලෙස පැවැත්වීමට සුදුසු යැයි ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**වෙනත් කරුණු**

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

සහකාර කොමසාරිස්තුමා අද දින අප සභාවට පැමිණ අනාගත වැඩ කටයුතු පිළිබඳවත්, අපේ ආදායම් උත්පාදනය කර ගන්නා ආකාරය පිළිබඳවත් උපදෙස් දුන්නා. ඒ පිළිබඳව ස්තූතිවන්ත වෙමින්, විශේෂයෙන් මේ අවස්ථාවේ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පැමිණ මේ සම්බන්ධව දැනුවත් වුණා. විශේෂයෙන්ම කියන්න ඕන. අද දින සහභාගී වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වෙමින් අද දින සභා කටයුතු අවසන් කරනවා. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:-